# සිංහල

## දෙවන වසර

## මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමුවන මුද්‍රණය - 2012
දෙවන මුද්‍රණය - 2013
තුන්වන මුද්‍රණය - 2014
සිව්වන මුද්‍රණය - 2015
පස්වන මුද්‍රණය - 2016
හයවන මුද්‍රණය - 2017
හත්වන මුද්‍රණය - 2018
අටවන මුද්‍රණය - 2019
නවවන මුද්‍රණය - 2020

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0436-5

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නුගේගොඩ, ගංගොඩවිල, උඩහමුල්ල දුම්රියපළ පාර, නො. 44 දරන
ස්ථානයෙහි පිහිටි නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by: Educational Publications Department
Printed by: Neo Graphics (Pvt) Ltd

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජයභූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජයභූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නොව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

සියවස් ගණනාවක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය වූ කලී සිරිලක අධ්‍යාපනයේ ස්වර්ණමය සලකුණකි. මහින්දාගමනයත් සමඟින් වඩාත් ශිෂ්ට සම්පන්න සංස්කෘතියක් වෙත අප ගමන් කළේ සුවිශේෂ වූ ශාස්ත්‍රීය දියුණුවක් ද අත්පත් කරගනිමිනි. එහිදී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස වෙතම ප්‍රභාෂ්වර ශාස්ත්‍රාලෝකය දායාද කළ ප්‍රදීපස්තම්භය වූයේ පිරිවෙනයි.

අපේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය, ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් කැපවන සුපසන් යතිපරපුරක් නිර්මාණය කරන අතර සම්භාව්‍ය භාෂා මෙන්ම අනේක ශිල්ප ශාස්ත්‍ර පිරිසිඳ දත් වියතුන් ලොවට දායාද කිරීමෙහිලා මූලික වූ බැව් සිහිපත් කළ යුතු ය. එසේම මෙරට විවිධ උවදුරු පිරි අඳුරු සමයන්හි පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය යළි නඟා සිටුවීමට දිවිහිමියෙන් ඇප කැප වූ, වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ අපරිමිත සේවාව ද කෘතවේදීත්වයෙන් යුතුව මේ මොහොතේ  සිහිපත් කළ යුතු ය.

අතීත සම්භාවනීය අධ්‍යාපන උරුමය ද එකලෙසින් සුරකිමින් නව ලොවට අනුගත වූ පිරිවෙන් විද්‍යාස්ථාන නිර්මාණය කිරීමේ කාර්යය වෙත අපි සැම අවතීර්ණ වී සිටින්නෙමු. විශ්ව ගම්මානයෙහි හුදකලා නොවී වර්තමාන පිරිවෙන් ශිෂ්‍ය ගණයා දැනුම,  කුසලතා හා ආකල්ප වර්ධනය කරගනිමින් අධ්‍යාපන සයුරෙහි කිමිදෙමින් සිටිනු දැකීම සන්තුෂ්ටිය උපදවන්නකි. විවිධ ගැටලු හේතුවෙන් විධිමත් පාසල් පද්ධතියෙන් බැහැර වූ ඇතැම් සිසුන් ද යළි පිරිවෙන් විදුබිම් වෙත පැමිණ ස්වකීය දිවිමඟ යළි එළිය කරගත් අවස්ථා සඳහා නිදසුන් අපමණ බව සඳහන් කළ යුතු ය. සැමට අධ්‍යාපනය ලබාදීමේ උත්කෘෂ්ට කර්තව්‍යය වෙනුවෙන් පිරිවෙන් විද්‍යාස්ථාන ද ඇප කැප වී සිටින බවට එය කදිම සාක්ෂ්‍යයකි.

මෙම පොත් මැනවින් පරිශීලනය කරමින් ඒ ඔස්සේ නව නවත් පුළුල් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත පිවිසෙන්නට ද ඔබ සැමට ඇරයුම් කරමි. මනා ඉගෙනුමක් ලැබූ හා ආධ්‍යාත්මික සුවපත් භාවයෙන් පිරිපුන් සුපසන් සිසු පරපුරක් බිහිවනු දැකීම රජයේ ඒකායන අරමුණයි. ඒ සඳහා ඇප කැපවන්නට හැකිවේවායි සියලු දෙනා වෙත ආශිර්වාද කරමි. මේ සත්කාර්යය වෙනුවෙන් නොමසුරු දායකත්වයක් සැපයූ සියලු පිරිවර වෙත ද මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

**පී. එන්. අයිලප්පෙරුම**

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඉසුරුපාය

බත්තරමුල්ල

**නියාමනය හා අධීක්ෂණය**

| | |
|---|---|
| **පී. එන්. අයිලප්පෙරුම** | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**මෙහෙයවීම**

| | |
|---|---|
| **පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි** | අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්),<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |
| **ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි** | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| පූජ්‍ය රංවල පඤ්ඤාවාස හිමි | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>(පිරිවෙන් සම්බන්ධීකරණ)<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |
| ඩී. එම්. ජේ. පුෂ්පකුමාර | නියෝජ්‍ය කොමසාරිස් (පාලන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**උපදේශක මණ්ඩලය**

| | |
|---|---|
| පූජ්‍ය බලංගොඩ සෝභිත නාහිමි | පරිවේණාධිපති,<br>විද්‍යෝදය මහ පිරිවෙන, මරදන, කොළඹ 10. |
| මහාචාර්ය විමල් ජී. බලගල්ලේ | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,<br>නුගේගොඩ. |
| මහාචාර්ය රත්න විජේතුංග | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,<br>නුගේගොඩ. |
| මහාචාර්ය ඊ. ඒ. වික්‍රමසිංහ | ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,<br>හෝමාගම. |
| මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන | සිංහල අධ්‍යයන අංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය. |

**ලේඛක මණ්ඩලය**

| | |
|---|---|
| එල්. ඒ. සුනිල් ප්‍රේමරත්න (සභාපති) | සමස්ත ලංකා සිංහල විෂය උපදේශක, (පිරිවෙන්) අධ්‍යාපන අමාත්‍යාංශය. |
| පූජ්‍ය බුලත්ගම උපනන්ද හිමි | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්), අධ්‍යාපන අමාත්‍යාංශය. |
| නන්දන මිල්ලගල | පරිවේණාචාර්ය කෑ/සිරි නන්දන විද්‍යායතන පිරිවෙන, මොරදන උඩුගොඩ, කෑගල්ල. |
| පී. එල්. ලලිත් අබේසේකර | ගුරු උපදේශක (පිරිවෙන්) මධ්‍යම පළාත, ශ්‍රී සංඝරාජ මහ පිරිවෙන, මහනුවර. |

**සංස්කරණය**

| | |
|---|---|
| කුසුමලතා ලංකාමුල්ල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ. |

**සෝදුපත් කියවීම**

| | |
|---|---|
| වයි. පී. එන්. පී. විමලසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර. |

**පිටකවරය**

| | |
|---|---|
| කේ. යසිත මධුශාන් පෙරේරා | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**පරිගණක තාක්ෂණය**

| | |
|---|---|
| කේ. යසිත මධුශාන් පෙරේරා | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

# පටුන


පිටුව

1) අක්ෂර මාලාව 01

2) නාමපද 11

3) නිපාත 19

4) උපසර්ග 21

5) ආඛ්‍යාත පද 23

6) නෛපාතික කෘදන්ත 28

7) විවිධාර්ථවත් පද 31

8) වාක්‍ය නිර්මාණය 35

9) රචනය 43

10) සාරාංශකරණය 48

11) ප්‍රායෝගික ලේඛනය 52

12) අර්ථාවබෝධය 60

13) විරාම ලක්ෂණ 64

14) කාරක 70

# 1 අක්ෂර මාලාව

මිනිසා තම හැඟීම් හා අදහස් ලියා දැක්වීමට භාවිත කරන සංකේත, අක්ෂර නම් වේ. කථා ව්‍යවහාරයේ දී ශබ්ද භාවිතයට ගන්නා ඔහු ලේඛනයේ දී ඒ සඳහා යොදා ගන්නේ අක්ෂර සංකේත යි. භාෂාවක යෙදෙන මෙම සංකේත සිංහලයේ දී හෝඩිය, අකුරු, අක්ෂර, වර්ණ ලෙස හඳුන්වයි.

## 1.1 සාම්ප්‍රදයික සිංහල අක්ෂර මාලාව (මිශ්‍ර සිංහල අක්ෂර මාලාව)

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ
ඏ ඐ එ ඒ ඓ ඔ ඕ ඖ

ක ඛ ග ඝ ඞ
ච ඡ ජ ඣ ඤ
ට ඨ ඩ ඪ ණ
ත ථ ද ධ න
ප ඵ බ භ ම
ය ර ල ව
ශ ෂ ස හ ළ
(අ)ං (අ)ඃ

ඉහත දැක්වූයේ සාම්ප්‍රදයික සිංහල හෝඩියට අයත් අක්ෂර මාලාව යි. එය ප්‍රමාණයෙන් අක්ෂර පනස් හතරකින් (54) යුක්ත ය. එහෙත් නූතන සම්මත අක්ෂර මාලාවේ අක්ෂර හැටක් (60) දක්නට ඇත. ඒ අර්ධානුනාසික හෙවත් සඤ්ඤක යනුවෙන් හැඳින්වෙන

ඟ ඦ ඬ ඳ ඹ

යන අක්ෂර පහ සහ ෆ යන නව අක්ෂරය, අක්ෂර මාලාවට එකතු කිරීමෙනි. පහත දැක්වෙන්නේ ඒ අක්ෂර මාලාව යි.

## 1.2 නූතන සිංහල අක්ෂර මාලාව

අ ආ ඇ ඈ ඉ ඊ
උ ඌ ඍ ඎ ඏ ඐ
එ ඒ ඓ ඔ ඕ ඖ
(අ)ං (අ)ඃ

ක ඛ ග ඝ ඞ ඟ
ච ඡ ජ ඣ ඤ ඦ
ට ඨ ඩ ඪ ණ ඬ
ත ථ ද ධ න ඳ
ප ඵ බ භ ම ඹ
ය ර ල ව
ශ ෂ ස හ ළ ෆ

මෙයින් ඏ ඐ යන අක්ෂර දෙක සාම්ප්‍රදයික අක්ෂර මාලාවට අයත් වුව ද, නූතන සිංහලයේ භාවිත නොවේ.

## අවධානයට

වසර දෙදහසකටත් වැඩි ඉතිහාසයක්
තිබෙන සිංහල භාෂාව අපේ මවුබස යි.
අපේ මුතුන්මිත්තන් ඈත
අතීතයේ සිට ම ලියන්නට,
කියවන්නට දැන සිටීම
අපට මහත්
අභිමානයකි.
එය ඉදිරියට ද පවත්වාගෙන
යෑමට නම්, අප කළ යුත්තේ අපේ
භාෂාව හොඳින් ඉගෙන ගැනීම යි.
එහි දී අපේ පළමු පියවර
වන්නේ අක්ෂර මාලාව
මනා ව හැඳින ගෙන
ප්‍රගුණ කිරීම යි.

ක්‍රියාකාරකම 01

භාෂා හුරුව

පහත සඳහන් ඡේදය ශබ්ද නගා කියවන්න. පිටපත් කරන්න.

"................... ගුවන් කුස ගමන් ගෙන, ඒ වෙන් මග කෙමෙන් ගොස් අඹර සිට රඹගම් නුවරවර වොරදනා ණේදනා සතොසිනා මඟ තනා යන එනා දකිමිනා ගුවනිනා බසිමිනා, ඒ දන වෙතට ගොස් "අද දවස් වෙමින් තොස් මඟ සකස් කුම් උදෙස් කරනුව" යි

ඒ පිළිවිස් ඒ තවුස්හට ඒ තැන් පත් ඒ සත් හැම "මෙ වන් යුත් මෙ මාවත් මොහ ඳුරා කළ දුරා පැණසරා නවසරා මොකැඳුරා පියකරා සෙත් කරා දෙස්වරා මෙත්කරා දිවකුරා ලොවුතුරා මුනිවරා ඉසිවරා පිරිවරා සැරිසරා මෙ නුවරා හව්නරා මන් පුරා පින් පුරනුවස් වඩිනු වස්..........................."

දළදා සිරිත

**ක්‍රියාකාරකම 02**


i. අක්ෂර මාලාවේ සමාන හැඩ ඇති අක්ෂර තෝරාගෙන වගුවක් පිළියෙල කරන්න. උදාහරණ 1). ක ග හ න

2). අ උ ද ල

ii. "ට" අක්ෂරය ලිවීමේ දී දකුණෙන් පටන් ගෙන වමෙන් අවසන් වේ. "න" අක්ෂරය ලිවීමේ දී වමෙන් පටන් ගෙන දකුණෙන් අවසන් වේ. එසේ වමෙන් හා දකුණෙන් පටන් ගන්නා වෙනත් අකුරු තෝරා ලියන්න.

**ක්‍රියාකාරකම 03**

අක්ෂර මාලාවේ පිළිවෙළ අනුව අඩු අකුරු පුරවන්න.




## 1.3 අක්ෂර ප්‍රභේද

සිංහල අක්ෂර මාලාවේ ප්‍රධාන ප්‍රභේද දෙකකි.

- ස්වර
- ව්‍යඤ්ජන වශයෙනි.

අක්ෂර මාලාවේ **අ** සිට **ඖ** දක්වා ඇති අක්ෂර දහඅට ස්වර වේ. මේවා ප්‍රාණාක්ෂර, පණකුරු, සරකුරු, සර, සොරකුරු යනුවෙන් ද හැඳින්වේ. මෙම අක්ෂර වෙනත් අකුරක ආධාරයෙන් තොර ව, තනි ව ශබ්ද කළ හැකි ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| **අ** | **ආ** | **ඇ** | **ඈ** | **ඉ** | **ඊ** |
| **උ** | **ඌ** | **ඍ** | **ඎ** | **ඏ** | **ඐ** |
| **එ** | **ඒ** | **ඓ** | **ඔ** | **ඕ** | **ඖ** |

ස්වර අක්ෂර හ්‍රස්ව සහ දීර්ඝ වශයෙන් ද ප්‍රභේද දෙකකි.

ස්වර
- හ්‍රස්ව ස්වර - අ ඇ ඉ උ ඍ ඏ එ ඔ
- දීර්ඝ ස්වර - ආ ඈ ඊ ඌ ඎ ඐ ඒ ඓ ඕ ඖ

අක්ෂර මාලාවේ (අ)ං සිට ෆ දක්වා ඇති අකුරු හතළිස් දෙක (42) ව්‍යඤ්ජන අක්ෂර වේ. මේවා ගාත්‍රාක්ෂර, ගතකුරු, මළකුරු හා හසකුරු යනුවෙන් ද හඳුන්වයි. මේවා නිත්‍ය හල් (අල්) අකුරු වේ. මේවා උච්චාරණය පහසු වීම සඳහා ස්වර අකුරක් සමග යෙදේ.

උදා:- ක් + අ = ක
ප් + ඉ = පි

## (අ)ං (අ) ඃ සංකේත

මෙම අක්ෂර සංකේත දෙක සාම්ප්‍රදායික අක්ෂර මාලාවේ ව්‍යඤ්ජන අවසානයේ ද නූතන අක්ෂරමාලාවේ ව්‍යඤ්ජන ආරම්භයේ ද ස්ථානගත කර ඇත.

(අ) ං සංකේතය හඳුන්වන්නේ "අනුස්වාරය"යනුවෙනි. ඊට හේතුව එය ස්වරයකට අනුව යෙදෙන බැවිනි.

උදා:- අං - අංකෙළිය
ඉං - සිංහල
උං - වංහුං
එං - සෙංකඩගල
ඕං - දෝංකාරය ආදි වශයෙනි.

(අ) ඃ සංකේතය ද 'අ' කාරය සමග යෙදේ.

උදා:- අඃ - මනඃකල්පිත
අඃ - වයඃ කල්‍යාණ

## ව්‍යඤ්ජන අක්ෂර මාලාව

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

ව්‍යඤ්ජන ප්‍රභේද

| | |
|---|---|
| ක ඛ ග ඝ ඞ<br>ච ඡ ජ ඣ ඤ<br>ට ඨ ඩ ඪ ණ<br>ත ථ ද ධ න<br>ප ඵ බ භ ම | වර්ගාක්ෂර |
| ඞ ඤ ණ න ම | අනුනාසිකය |
| ක ච ට ත ප<br>ග ජ ඩ ද බ | අල්පප්‍රාණාක්ෂර |
| ඛ ඡ ඨ ථ ඵ<br>ඝ ඣ ඪ ධ භ | මහාප්‍රාණාක්ෂර |
| ඟ ඦ ඬ ඳ ඹ | සඤ්ඤකාක්ෂර |
| ය ර ල ව ළ | අන්තඃස්ථාක්ෂර |
| ශ ෂ ස හ ෆ | ඌෂ්මාක්ෂර |

## ක්‍රියාකාරකම 04

කොටුව තුළ ඇති අකුරු අතුරින් අදාළ අකුරු තෝරා වගුව පුරවන්න.

ඟ න ච ය ශ ග ඣ ඹ ෆ ළ
ර ඡ ට ථ ෂ ඤ ප ක ඵ ඞ
ණ ඪ

| අනුනාසිකය | අල්පප්‍රාණ | මහාප්‍රාණ | සඤ්ඤක | අන්තඃස්ථ | ඌෂ්මාක්ෂර |
|---|---|---|---|---|---|
| | | | | | |

### ක්‍රියාකාරකම 05

i. පහත සඳහන් තද කළු අකුරින් මුද්‍රණය කොට ඇති වචනවල ස්වර - ව්‍යඤ්ජන වෙන් කොට දක්වන්න.

අම්ල, දේශාභිමානය, ඓතිහාසික, මහෞෂධ, විරෝදර

උදා :- කුමුදුකර = ක් + උ + ම් + උ + ද් + උ + ක් + අ + ර් + අ

ii. පහත සඳහන් ස්වර - ව්‍යඤ්ජන ඇසුරෙන් වචන ගොඩනගන්න.

උදා:- **ර් + අ + ව් + ඉ + ඳ් + උ = රවිඳු**

ක් + උ + ම් + ඉ + හ් + ඉ + ර් + අ =

ව් + ඉ + ස් + ත් + ඍ + ත් + අ =

ද් + අ + ක් + ෂ් + ඉ + ණ් + අ + ද් + ඒ + ශ් + අ + ය් + අ =

අ + භ් + අ + ය් + අ + භ් + ඌ + ම් + ඉ =

ම් + ඕ + හ් + ආ + න් + ධ් + අ + ක් + ආ + ර් + අ =

iii. හිස්තැන් පුරවන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| ක් | + ...... | = කූ | ස් | + ...... | = සෘ |
| ...... | + ඊ | = පී | ජ් | + ඖ | = ...... |
| ප් | + ඖ | = ....... | ..... | + ඒ | = සේ |
| ස් | + ...... | = සූ | ග් | + ...... | = ගො |

## රේඵය, රකාරාංශය සහ යංශය

රේඵය, රකාරාංශය

( ර්‍ , ්‍ර )

පැරණි පොතපතෙහි ව්‍යංජන අකුරකට පෙර "ර්" කාරය යෙදෙන විට "ර්" කාරය රේඵය ( ර්‍ ) නම් සලකුණෙන් යෙදේ. උදා :- ධර්මය (ධ + ර් + ම + ය )

ස්වරාන්ත "ර්" කාරය ව්‍යඤ්ජනයකට පසුව යෙදෙන විට එම අකුර යටින් "ර" කාරයෙන් අඩක් ලිවීම රකාරාංශය ( ්‍ර ) නම් වේ.

**උදා :- ක්‍රමය ( ක් + ර් + අ = ක්‍ර)**

**යංශය (ය)**

ස්වරාන්ත "ය" කාරය ව්‍යඤ්ජනයක් පරව සංයුක්ත ව යෙදෙන විට "ය" කාරයේ අඩක් ව්‍යඤ්ජනය සමග බැඳ ලිවීම සම්ප්‍රදය යි. එම අර්ධ "ය" කාරය යංශය (ය) නම් වේ.

උදා :- **වාක්‍යය**

ක්‍රියාකාරකම 06

i. පහත සඳහන් වචන රේඵය හා රකාරාංශය යොදා නැවත ලියන්න.

**තර්කය , ක්‍රෝධය, භ්‍රමණය, විසර්ගය**
**වාර්තාව, සාර්ථක, ප්‍රමාණය, චක්‍රය**
**සර්පයා, කාලත්‍රය**

ii. "යංශය (ය)" සහිත වචන 10ක් සොයා ලියන්න.

## 1.4 අකාරාදි පිළිවෙළ

අක්ෂර මාලාවේ "අ" සිට "ෆ" දක්වා ඇති අක්ෂර පිළිවෙළ අකාරාදිය යි. යම් වචන මාලාවක් ඒ පිළිවෙළට සකස් කිරීම අකාරාදි පිළිවෙළ යි.

පියගැටපෙළ, ආසනය, බෝධිය, විහාරය, වෙහෙර, පන්සල, මළුව, ප්‍රාකාරය යන මෙම වචන මාලාව අකාරාදි පිළිවෙළට මෙසේ සකස් කළ හැකි ය.

ආසනය, පන්සල, පියගැටපෙළ, ප්‍රාකාරය, බෝධිය, මළුව, විහාරය, වෙහෙර

ක්‍රියාකාරකම 07

පහත සඳහන් වචන සමූහ, අකාරාදි පිළිවෙළට ලියන්න.

i. නාසය, කට, අත, ඇස, කන, දිව, හිස, දත්
ii. සිවුර, අඳනය, නානකඩය, අංශකඩය, පටිය, පාත්‍රය, කුඩය, දැළිපිහිය.
iii. ජේතවනාරාමය, වේළුවනාරාමය, පූර්වාරාමය, නිග්‍රෝධාරාමය, ඝෝෂිතාරාමය, කුක්කුටාරාමය, පාවාරිකාරාමය, අශෝකාරාමය

## 1.5 අක්ෂර වින්‍යාසය




ඉහත දැක්වූයේ ලක්සිරිපුර භාෂෝදය පරිවෙණාධිපති පණ්ඩිත හාමුදුරුවන් වහන්සේ ස්ථාන කීපයක දුටුවා යැයි පැවසූ දැන්වීම් කීපයකි. ඒ ගැන උන්වහන්සේ විස්තර කරන්නට යෙදුණේ "සිංහල භාෂා දිනය" වෙනුවෙන් සංවිධානය කළ විශේෂ දේශනයක දී ය. ඒ දේශනයෙන් කොටසක් පහත දැක්වේ.

"........................අද අපේ රටේ ශිෂ්‍ය අවදියේ සිටින්නන් විතරක් නොවෙයි, වැඩිහිටි අය පවා සිංහල භාෂාව ඉගෙනීම ගැන ලොකු උනන්දුවක් දක්වනවා.......ඒ වුණාට භාෂාව ලිවීමේදී අක්ෂර නිවැරදි ව පාවිච්චි කරන්නේ නෑ කියල යි හිතෙන්නෙ.

.......... එසේ වචනවල අක්ෂර නිවැරදි ලෙස ලියන ආකාරය තමයි අක්ෂර වින්‍යාසය කියලා කියන්නෙ. අක්ෂර වින්‍යාසය නිවැරැදි නැත්නම් වචනවල තේරුම වරදින්න පුළුවන් . බලන්න මේ වචන ටික ..........

| වචනය | අර්ථය |
|---|---|
| නුවන<br>නුවණ | ඇස<br>සැණය |
| මල<br>මළ | පුෂ්පය<br>මැරුණු |

වැරදි ලෙස අල්පප්‍රාණ, මහප්‍රාණ අකුරු යොද ලියා ඇති, මා මුලින් කියූ දන්වීම්













............ මේ විදිහට පුළුවන් තරම් නිවැරැදි ව වචන ලියන්න උත්සාහ ගන්න ඕනෑ......

නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන ලිවීමට පුරුදු විය හැක්කේ

1) භාෂාවේ, අක්ෂර යෙදී ඇති අයුරු හැදෑරීමෙන්

උදා :- තුළ, විලාසය

2) ඒ සඳහා ඇති රීති හැදෑරීමෙන්

ඉෂ්ඨ ප්‍රත්‍යය සහිත වචනවල "ඨ" කාරය යෙදේ.

**උදා :- ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ**

නිවැරදි ලෙස ලිවීමට දැන ගත යුතු අක්ෂර වර්ග කිහිපයක් ඇත.

ක ච ට ත ප
ග ජ ඩ ද බ } අල්පප්‍රාණ

ඛ ඡ ඨ ථ ඵ
ඝ ඣ ඪ ධ භ } මහප්‍රාණ

ක්‍රියාකාරකම 08

i. පහත සඳහන් වචනවල හිස්තැනට සුදුසු අක්ෂරය තෝරා ලියන්න.

| | | |
|---|---|---|
| ලේ.......නය (ක /ඛ) | ප්‍ර...ඵලය (ති/ථි) | ප්‍ර....ල (බ/භ) |
| මජ්.....ම (ජි/ඣි) | සං...යනාව (ඝා/ගා) | ශිෂ්.... (ට/ඨ) |
| .....න්දදායකයා (ච/ඡ) | ප්‍රෞ... (ඩ/ඪ) | කනිෂ්... (ට/ඨ) |
| ස......ල (ප/ඵ) | | |

ii. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා ලියන්න.

(අ) .......................... මිනිස්සු ලොව බොහෝ ඇත. (ආත්මාර්ථකාමී/ආත්මාර්තකාමී)

(ආ) .......................... නම් වෙළෙන්දකු ගැන සේරිවාණිජ ජාතකයේ දී කියවේ. (කච්චපුට/කච්ඡපුට)

(ඉ) විහාරස්ථානයේ පැවති පිරිත් .................. අතිමිහිරි ය. (සජ්ජායනාව/සජ්ඣායනාව)

(ඊ) ............................... දුම්රිය නුවර බලා පිටත් වේ. (සීග්‍රගාමී/ශීඝ්‍රගාමී)

(උ) මහ වැසි වැටීමෙන් ................. රැසක් විනාශ විය. (දන්‍යාගාර/ධාන්‍යාගාර)

පැවරුම

අල්පප්‍රාණ සහ මහප්‍රාණ අක්ෂරවලට සියලු ස්වර යෙදීමෙන්, ලැබෙන අක්ෂර සංකේත ඇතුළත් පොතක් නිර්මාණය කරන්න.

# 2 නාමපද

සිංහල භාෂාවේ භාවිත වන පද වර්ග ගණනාවකි. ඉන් නාමපද යනු එක් පද විශේෂයකි. සත්ත්වයෙක්, ස්ථානයක්, වස්තුවක්, සංකල්පයක් හඳුන්වන පද නාම පද වේ. නාමපදයක මුල් ස්වරූපය ශබ්ද ප්‍රකෘතිය හෙවත් ශබ්ද මූලය නම් වේ. ශබ්ද මූලය විවිධ අරුත් ගැන්වෙන සේ නැමීම නාමපදයි. ශබ්ද ප්‍රකෘතිය අගට විභක්ති ප්‍රත්‍යය එකතු වීමෙන් විවිධාර්ථවත් නාමපද සෑදේ. නාමපද ප්‍රධාන වශයෙන් ප්‍රාණවාචී, අප්‍රාණවාචී, ලෙස බෙදු දැක්විය හැකි ය. නාමයක් විවිධ අරුත් දෙමින් විභක්ති, ලිංග, වචන, අනුව නැමෙන ආකාරය හෙවත් වෙනස් වන ආකාරය නාම වරනැගීම ලෙස හැඳින්වේ.

පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න.

සවස් වන්නට පටන් ගත්තේ ය. මිනිස්සු වැඩපල අවසන් වී නිවෙස් කරා පැමිණෙමින් සිටියෝ ය. වටින් පිටින් කළුවර වැටුණි. දිවා කාලයේ කෑම සොයමින් එහෙ මෙහෙ සැරිසැරූ කුරුල්ලෝ කැදලි කරා පියෑඹූහ. පරිසරය සිසාරා හමා ගිය මඳ සුළඟින් ගස්වල වියළි කොළ ගිලිහී බිම පතිත විය. නිවසේ දොරකඩට වී කාන්තාවක් තම සැමියා එන තුරු බලා සිටියා ය.

ඉහත සඳහන් ඡේදයේ **මිනිස්සු**, කුරුල්ලෝ, ගස්වල, කාන්තාවක් යන වචන (පද) නාම පද කීපයකි. එම නාමපදවල මුල් ස්වරූපය හෙවත් ශබ්ද ප්‍රකෘතිය "මිනිස්" "කුරුලු" "ගස්" "කාන්තා" යනුවෙන් යෙදේ. මිනිස් නමැති ශබ්ද ප්‍රකෘතියට විවිධ විභක්ති ප්‍රත්‍යය එකතු කිරීමෙන් විවිධ නාමපද සකස් කර ගත හැකි ය.

උදා:- මිනිසා, මිනිසුන්, මිනිසුනි, මිනිසාට, මිනිසාගේ, මිනිසාගෙන්

මේ ආකාරයට අනෙක් ශබ්ද ප්‍රකෘති ද එලෙසින් විවිධාර්ථ ගෙන දෙන නාම පද ලෙස සකස් කර ගත හැකි ය. මෙසේ ශබ්ද ප්‍රකෘතිය සමග විභක්ති ප්‍රත්‍යය සංයෝග කිරීම වරනැගීම නම් වේ. විභක්ති නවයකි. ප්‍රථමා, කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර, ආලපන යනුවෙනි.

නාම වරනැගීමේ දී වචන භේදය, ලිංග භේදය අනුව ද වෙනස් වේ.

නාම
- විභක්ති → ප්‍රථමා,කර්ම,කර්තෘ,කරණ,සම්ප්‍රදාන,අවධි,සම්බන්ධ, ආධාර,ආලපන
- ලිංග → පුරුෂ, ස්ත්‍රී, නපුංසක
- වචන → ඒකවචන, බහුවචන

කුකුළු ශබ්දය පුරුෂ ලිංග

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා (පෙර) | කුකුළා | කුකුළෝ |
| කර්ම (කම්) | කුකුළා | කුකුළන් |
| කර්තෘ (කතු) | කුකුළා විසින් | කුකුළන් විසින් |
| කරණ (කරණ) | කුකුළා කරණ කොට | කුකුළන් කරණ කොට |
| සම්ප්‍රදාන (සපදන්) | කුකුළාට | කුකුළන්ට |
| අවධි (අවදි) | කුකුළාගෙන් | කුකුළන්ගෙන් |
| සම්බන්ධ (සබඳ) | කුකුළාගේ | කුකුළන්ගේ |
| ආධාර (අදර) | කුකුළා කෙරෙහි | කුකුළන් කෙරෙහි |
| ආලපන (අලප්) | කුකුළ ! | කුකුළනි ! |

කිකිළි ශබ්දය ස්ත්‍රී ලිංග

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා (පෙර) | කිකිළි / කිකිළිය | කිකිළියෝ |
| කර්ම (කම්) | කිකිළිය | කිකිළියන් |
| කර්තෘ (කතු) | කිකිළිය විසින් | කිකිළියන් විසින් |
| කරණ (කරණ) | කිකිළිය කරණ කොට | කිකිළියන් කරණ කොට |
| සම්ප්‍රදාන (සපදන්) | කිකිළියට | කිකිළියන්ට |
| අවධි (අවදි) | කිකිළියගෙන් | කිකිළියන්ගෙන් |
| සම්බන්ධ (සබඳ) | කිකිළියගේ | කිකිළියන්ගේ |
| ආධාර (අදර) | කිකිළිය කෙරෙහි | කිකිළියන් කෙරෙහි |
| ආලපන (අලප්) | කිකිළිය ! | කිකිළියනි ! |

පොත් ශබ්දය නපුංසක ලිංග

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා (පෙර) | පොත | පොත් |
| කර්ම (කම්) | පොත | පොත් |
| කර්තෘ (කතු) | පොත විසින්/පොතින් | පොත් විසින්/පොත්වලින් |
| කරණ (කරණ) | පොත කරණ කොට | පොත් කරණ කොට |
| සම්ප්‍රදාන (සපදන්) | පොතට | පොත්වලට |
| අවධි (අවදි) | පොතෙන් | පොත්වලින් |
| සම්බන්ධ (සබඳ) | පොතේ | පොත්වල |
| ආධාර (අදර) | පොතේ | පොත්වල |
| ආලපන (අලප්) | පොත | පොත් |

නාම පද පිළිබඳ තවදුරටත් අවබෝධ කරගැනීම සඳහා පහත සඳහන් ගීතය රසවිඳින්න.

ආදරයේ උල්පත වූ අම්මා
මා ඔබගේ පුතුවූ............
ඔබ මතු බුදු වන දවසේ
මා රාහුල කුමරුන් සේ...........
සෙවණ පතා අද මෙන් පැමිණෙන්නෙමි
සුළැඟිල්ලේ එල්ලී.......

සඳ දිය කොට කිරි වතුරෙන්
ඒ දියරෙන් මුව දෝවා
දිවමතුරක් වන් නැළවිලි ගීයෙන්
මතකයි මා.......නැළවූවා
ජීවිතයෙන් ජීවිතයක් ගෙන දී
ඒ ජීවිතයට කිරි දී පණ දී
මා දැඩි කළ අම්මා.......

ආදරයේ උල්පත වූ අම්මා.............

තුරුලට ගෙන අත් පා හැඩ ගස්වා
නිදි ගන්වා.......... යහන් ගැබේ
සිහිනෙන් ගෑ සුවඳක් මෙන්
සිහි වෙයි ඒ කිරි සුවඳ ඔබේ
දවසින් දවසට සෙනෙහස ළබැඳී
ගෙන දී දිවියට නව පණ ලැබ දී
මා දැඩි කළ අම්මා

ආදරයේ උල්පත වූ අම්මා.............

පද රචනය - ප්‍රේමකීර්ති ද අල්විස්

ක්‍රියාකාරකම 2.1

i. මේ ගීතයේ ඇතුළත් නාම පද පහක් තෝරා ලියන්න.
ii. ගීතයේ තද කළු අකුරින් යොදා ඇති නාම පදවල (පුතු, කුමරුන්) ශබ්ද ප්‍රකෘතිය හඳුනා ගෙන සියලු විභක්තිවල වරනගන්න.
iii. පහත සඳහන් නාම පදවල ශබ්ද ප්‍රකෘතිය වෙන් කොට දක්වන්න.
උකුස්සෝ, මිනිසුන්, කුමරාට, ළඳුන්ගේ, අත්වලින්.

## 2.1 නාම ප්‍රභේද

පද්‍ය පන්තිය ඇසුරෙන් නාම ප්‍රභේද හඳුනා ගනිමු.

"ගඟ"

ටිකින් ටික ම කඳු මුදුනෙන් බැස්ස නුඹයි
සැදි වැඩී ගම්මානෙට ගැලූ නුඹයි

ටික්කි ටිකිරි හුරතල් ළදැරියක් වගේ
කැකිරි සිනාවෙන් බැස ආ ගමන අගේ

ඇළ දොළවල් එක්වුණු පසු සැදී වැඩී
මුහුදට ගලා යන ගමනේ වේගෙ වැඩී

නෙළුම් මීලු දිය මානෙල් සැදී — පිපේ
ඒ මල් නෙළමු පැදගෙන ගොස් ඔරුව — අපේ

දණ්ඩි කුනි පෙතියෝ ගොඩයෝ — ඉස්සෝ
පැන්නෝ කට්ල්ලෝ කාවයියෝ — කොස්සෝ

එහෙන් මෙහෙන් පීනන ලස්සනක — හැටී
කිඹුලා මිනී කන්නෙකි සැඟවිලා — සිටී

පද රචනය - ආනන්ද රාජකරුණා

මෙම පද්‍ය පන්තියේ තද කළු පැහැයෙන් යොද ඇත්තේ නාම පද කීපයකි. එම පදවල හඳුනාගත හැකි ලක්ෂණ පහත දක් වේ.

"කිඹුලා" - ජාති නාමයකි, සත්ත්ව වර්ගයක්, ජාතියක් නියෝජනය කරන බැවිනි.

"කැකිරි" = ද්‍රව්‍ය නාමයකි, කිසියම් ද්‍රව්‍යයක් හැඳින්වීමට යොදන බැවිනි.

"හුරතල්" = ගුණ නාමයෙකි, කිසියම් ගුණයක්, ස්වභාවයක් හැඳින්වීමට යොදන බැවිනි.

"කන්නෙකි"- ක්‍රියා නාමයකි, ක්‍රියා අර්ථයක් ප්‍රකට කරන නාමයක් බැවිනි.

මෙම පද්‍ය පන්තියේ රචකයා වන,

"ආනන්ද රාජකරුණා" - සංඥ නාමයකි, කිසියම් පුද්ගලයෙක්, ස්ථානයක්, දෙයක් වෙන් කොට හඳුනා ගැනීමට යොදන හෙයිනි.

ක්‍රියාකාරකම 2.2

i. පහත දී ඇති නාම පද වගුගත කරන්න.
කැරපොත්තා, සීනි, නගන්නා, උස, මගුරා, සෝදන, තරබාරු, නිමල්, දුරකථනය, ලේනා, වජ්මහල්, කුරුල්ලා, යන්නෝ, අල්මාරිය, රතනපාල, ගයන්නී, බෝතලය, වේගය, අලංකාර, සැරසීම, හිරමණය, මන්දිරය

| ජාති | ද්‍රව්‍ය | ගුණ | ක්‍රියා | සංඥ |
|---|---|---|---|---|
| | | | | |

ii. ඔබ හඳුනාගෙන වගුගත කළ ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා නාම පද භාවිත කරමින් අර්ථවත් වාක්‍ය දහයක් සාදන්න.

iii. පන්තියේ සිසුන් කණ්ඩායම් පහකට බෙදී ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥ නාම පනහ බැගින් වන වගුවක් සාද පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

දැනුම සඳහා කියවන්න

භාෂාව යනු ,
මිනිසා දිගුකලක් තිස්සේ තමා ලත් දැනුම, කුසලතා, ආකල්ප, චින්තන, හැකියා යනාදිය නිදන් කර තබා ගැනීමටත්, අන් අයට සන්නිවේදනය කිරීමටත් තනා ගත් උපකරණයකි.

# සර්ව නාම


නාම පද වෙනුවට විශේෂයක් නොමැති ව යෙදිය හැකි නාම සර්වනාම ලෙස හැඳින්වේ.

**ගොවියා** කුඹුර කොටයි.



**ඔහු** රටට සම්පතකි.

**රාහුල හිමි** පාඩම් කරයි.



**උන්වහන්සේ** දක්ෂ ශිෂ්‍යයෙකි.

**කමනි** මිදුල අතුගායි.



**ඈ** පිරිසිදුකමට කැමති ය.

**ගවයා** තණ කයි.



**ඌ** අහිංසක සතෙකි.

**අඹ ගස** ඵල දරයි.



**එය** සුරැකීම අපගේ යුතුකම යි.

**ශ්‍රී ලාංකිකයෝ** සමගි ව ජීවත් වෙති.



**අපි** ඒ ශ්‍රී ලාංකිකයෝ වෙමු.

පින්තූරයට මුලින් සහ පසුව යොදා ඇති වාක්‍ය දෙස බලන්න. මුල් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත එක් එක් නාමපදය වෙනුවට පසුව ඇති වාක්‍යවල වෙනත් නාමපද විශේෂයක් තද කළු අකුරින් මුද්‍රණය කර ඇත. එම නාම පද සර්ව නාම ලෙස හැඳින්වේ.

### ක්‍රියාකාරකම 2.3

ගුරු බස සැබෑමය
එය පිළිගැනුම යුතුමය
පඬි බසත් එයමය
එයින් දෙලොවෙහි මහත් සැපමය

යම්කිසි ගෙදරකට
ගිය කල හීනෑ කමකට
ඔවුන් නොම දක ගෙට
ඇතුළු නොමවන් නො හොබි සිරිතට

යකෝ යන බස් නොහොබී සිතන්නෙ
උඹ මූ යන බස් කැතයි අසන්නෙ
තෝ බොල යන බස් දුරු කරපන්නෙ
පිරිය වඩන බස් පවසාපන්නෙ

**සිරිත් මල්දම**

i. ඉහත සඳහන් පද්‍ය පාඨවල ඇතුළත් සර්ව නාම පද තෝරා ලියන්න.
ii. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු සර්ව නාම පදය කොටුව තුළින් තෝරා ලියන්න.

(අ) ................ පැළ සිටුවද්දී අපි උදව් කළෙමු.

(ආ) .................. ඇඳුම් පිරිසිදු කළා ය.

(ඇ) ................. සුරාවට ගිජු වෙයි.

(ඉ) නටත් .................. සුරා මතින්.

(ඊ) වැසි වසිද්දී ............ ගෙදර ආවේ ය.

(උ) දරුව .............. නො හඬව.

(ඌ)............... මුසා බෙණෙති.

(එ)............... බුදු සරණයි.

මම , තෝ , තී , තා , තොපි
උඹ , නුඹ ,ඔහු , හේ , ඔබ
හෙතෙම, ඒ, සැමට, මේක.
ඒවා , මේවා , අරක.
අරයා , සමහරෙක්.
ඔවුන්, අයෙක්, ඕ
ඇතැමෙක්
ඇතැම්හු

සර්ව නාම පදවල ලිංග භේදය, පුරුෂ භේදය, වචන භේදය දක්නට ලැබෙන අතර එම පද සියලු විභක්තිවල (ආලපන හැර) වර නැගේ.

ප්‍රථම පුරුෂ "ඒ" ශබ්දය පුරුෂ, ස්ත්‍රී, නපුංසක ලිංග තුනේ ම ද, (ආලපන හැර) සියලු විභක්තිවල ද වරනැගේ.

මධ්‍යම පුරුෂ "ත" ශබ්දය පුරුෂ, ස්ත්‍රී ලිංගවල සහ සියලු විභක්තිවල ද (ආලපන හැර) වරනැගේ.

උත්තම පුරුෂ "ම" ශබ්දය ලිංග භේදයෙන් තොර ව සියලු විභක්තිවල (ආලපන හැර) වරනැගේ.

ප්‍රථම පුරුෂ "ඒ" ශබ්දය පුරුෂ ලිංගයෙහි වරනැගීම.

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | හේ/ඔහු/ ඌ | ඔහු/ඔවුහු/උහු |
| කර්ම | ඔහු/ ඌ | ඔවුන්/ උන් |
| කර්තෘ | ඔහු විසින් /ඌ විසින් | ඔවුන් විසින් /උන් විසින් |
| කරණ | ඔහු කරණ කොට/<br>ඌ කරණ කොට | ඔවුන් කරණ කොට/<br>උන් කරණ කොට |
| සම්ප්‍රදාන | ඔහුට / ඌට | ඔවුන්ට /උන්ට |
| අවධි | ඔහුගෙන් /ඌගෙන් | ඔවුන්ගෙන් /උන්ගෙන් |
| සම්බන්ධ | ඔහුගේ /ඌගේ | ඔවුන්ගේ/උන්ගේ |
| ආධාර | ඔහු කෙරෙහි / ඌ කෙරෙහි | ඔවුන් කෙරෙහි/උන් කෙරෙහි |

ප්‍රථම පුරුෂ "ඒ" ශබ්දය ස්ත්‍රී ලිංගයෙහි වරනැගීම.

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ඕ / ඈ | ඔවුහු |
| කර්ම | ඇය | ඔවුන් |
| කර්තෘ | ඇය විසින් | ඔවුන් විසින් |
| කරණ | ඇය කරණ කොට | ඔවුන් කරණ කොට |
| සම්ප්‍රදාන | ඇයට | ඔවුන්ට |
| අවධි | ඇයගෙන් | ඔවුන්ගෙන් |
| සම්බන්ධ | ඇයගේ | ඔවුන්ගේ |
| ආධාර | ඇය කෙරෙහි | ඔවුන් කෙරෙහි |

ප්‍රථම පුරුෂ "ඒ" ශබ්දය නපුංසක ලිංගයෙහි වරනැගීම.

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | ඒ/එය | ඒවා |
| කර්ම | එය | ඒවා |
| කර්තෘ | එයින්/ඉන් | ඒවායින්/ඉන් |
| කරණ | එය කරණ කොට | ඒවා කරණ කොට |
| සම්ප්‍රදාන | එයට | ඒවාට |
| අවධි | එයින් | ඒවායින්/ ඉන් |
| සම්බන්ධ | එහි | ඒවායේ/එහි |
| ආධාර | එහි | ඒවායේ/එහි |

මධ්‍යම පුරුෂ "ත" ශබ්දය පුරුෂ/ස්ත්‍රී ලිංගයන්හි වරනැගීම

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | තෝ /තී /ඔබ | තෙපි/ ඔබ |
| කර්ම | තා /තී /ඔබ | තොප /ඔබ |
| කර්තෘ | තා විසින්/තී විසින්/ඔබ විසින් | තොප විසින් /ඔබ විසින් |
| කරණ | තා කරණ කොට/තී කරණ කොට | තොප කරණ කොට/ ඔබ කරණ කොට |
| සම්ප්‍රදාන | තට /තිට/ඔබට | තොපට /ඔබට |
| අවධි | තාගෙන්/තිගෙන්/ඔබගෙන් | තොපගෙන් /ඔබගෙන් |
| සම්බන්ධ | තාගේ/තිගේ/ඔබගේ | තොපගේ /ඔබගේ |
| ආධාර | තා කෙරෙහි/තී කෙරෙහි/ඔබ කෙරෙහි | තොප කෙරෙහි/ ඔබ කෙරෙහි |

උත්තම පුරුෂ "ම" ශබ්දය වරනැගීම.

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා | මම | අපි |
| කර්ම | මා | අප |
| කර්තෘ | මා විසින් | අප විසින් |
| කරණ | මා කරණ කොට | අප කරණ කොට |
| සම්ප්‍රදාන | මට | අපට |
| අවධි | මාගෙන් | අපගෙන් |
| සම්බන්ධ | මාගේ | අපගේ |
| ආධාර | මා කෙරෙහි | අප කෙරෙහි |

**ක්‍රියාකාරකම 2.4**

ඔබ ඉගෙන ගත් සර්ව නාම පද ඇසුරු කරමින් අර්ථවත් වාක්‍ය දහයක් සාදන්න.

සංකල්පනා.........

| | |
|---|---|
| ජීවිතය ඉහලාගෙන ඇති | කුඩයක් ය |
| මිනිසා එය උසුලා සිටි | කණුවක් ය |
| අටලෝ දහම එහි ඇති නාණ | අටලෙස ය |
| මරණය කුඩය අකුළන එහි | ඇණයක් ය |

# 3 නිපාත

නාම පද හා ක්‍රියා පදවලට අමතර ව භාෂාවේ යෙදෙන පද විශේෂයකි, අව්‍යය පද. විභක්ති, ලිංග, කාල වචන වශයෙන් කිසිදු වෙනසකට පත් නොවී එක ම ස්වරූපයෙන් තිබීම අව්‍යය පදවල ලක්‍ෂණය යි. නිපාත යනු ඒ අව්‍යය පද අතර එක් කොටසකි.

ප වී  මීස පිනෙකැයි නොකරන හැම  කල
මු නි බණ නො පවතිනා පිට  සක්වළ
නි සි ලෙස උපනත් ලැබ දන  මනකල
කි සි  කලෙකත් කුසලක් නො කළැකි  බල

පස් පවි කොට මෙ තැනත් ලැබ  සෝකය
ගොස් නිරයේ දුක් විඳිති  අනේකය
රැස් කොට ඉන් පින් මෙමිනිස්  ලෝකය
සිස් නො කරවු කලෙකින් ලත් මේ  කය

තැත කින් ගෙන දැමුවත් කැට නුබ  කුස
අ  ත රක නොරඳන මෙන් මේ බිම  මිස
සි  ත සතොසින් පින් නො කළොත් තිසි  ලෙස
නැත සිටිනා තැන් සතර අපා  මිස

ලෝවැඩ සඟරාව

ඉහත කවි පන්තියේ තද කළු අකුරින් මුද්‍රිත ව ඇත්තේ නිපාත පද යි. ඒවා මුළු රචනාව පුරා විවිධ අර්ථ දෙමින් යෙදී ඇත. වාක්‍යයක මුල, මැද, අග විශේෂයක් නැති ව යෙදෙන (වැටෙන) යන අර්ථයෙන් නිපාත යන නම එම පදවලට ලැබී ඇත.

## නිපාත පදවල ප්‍රයෝජන හඳුනා ගනිමු

1. වාක්‍ය අලංකාරයට

   උදා:- **ඉක්බිති** රාහුල තෙරණුවෝ **වනාහි** දෙව්රම් වෙහෙර **බලා** වැඩම කළහ.

2. වාක්‍ය සම්පූර්ණයට

   උදා:- දුටුගැමුණු**ත්** පරාක්‍රමබාහු**ත්** විජයබාහු**ත්** පෙර ලක්දිව රජ දරුවෝ ය.

**යෙදෙන අර්ථය අනුව නිපාත පද වර්ග රාශියකි. මෙයින් කිහිපයක් පහත දැක්වේ.**

01. සමුච්චයාර්ථය (පද එක් කිරීමේ අර්ථය)

**ද** -සේනානායක **ද** සේරසිංහ **ද** අශෝකාරාමයට ගියහ.

**ත්** -දයක සභාවේ සභාපතිතුමා**ත්** ලේකම්තුමිය**ත්** ගමනට සහභාගි වූහ.

02. එක්ව යන අර්ථයේ

**සහ** -දයාපාල **සහ** කරුණාදස මත්පැනට විරුද්ධ වෙති.

**කැටුව** -බුදුන් වහන්සේ ආනන්ද හිමි **කැටුව** ගිජුකුළු පව්වට වැඩි සේක.

03. ප්‍රශ්නාර්ථයේ

**ද** -ඔබවහන්සේ වැඩම වන්නේ සැවැත් නුවරට ද?

**කෙසේ** -උත්සාහවත් නොවී විභාග ජය ගන්නේ කෙසේ ද?

04. කාලාර්ථයේ

**අද** -**අද අද** එයි මරු පින් කර ගන්නේ

**හෙට/සෙට** -කෙලෙසද සෙට මරු නේති සිතන්නේ

05. ඛේදාර්ථයේ/ භාව සූචනාර්ථයෙහි

**අහෝ** **අහෝ** ! සසර කරුමෙක මහත

**අපොයි** -**අපොයි** ! මෙවැනි දුකක් නම් නොවේවා !

**හා** -**හා** ! කොච්චර හොඳ ද ආ එක.

3.1 ක්‍රියාකාරකම

i. පහත ඡේදයේ ඇති නිපාත පද තෝරා ලියන්න.

මහ මුහුදටත් කඳුවැටිවලටත් අතර පහත රට තැනිතලා ප්‍රදේශයක පිහිටි ගමකි, බැද්දේගම. ඒ අවටින් වූයේ ඝන කැලෑවකි. මෙසේ කැලෑවට බැද්දට මැදි වී සිටි හෙයින් ඒ ගමට බැද්දේගම යන නම ඉබේ ම ඇති වූවකි. මහමුහුදක් සේ පෙනුණු ගම වටා පිහිටි වන රොද නිසා ඈත උතුරෙන් වූ කඳු වැටි උස් වූ පවුරු බිතක සිරිය ඉඳුරා පළ කළේ ය. උණුසුම් වාතය ද, දූවිලි ද, වියළී පොඩි වී ගිය දඬුපත් ද පිස ගෙන ආ වන ගඳ ගම පුරා පැතිර සිටියේ ය.

-බැද්දේගම-
-ලෙනාඩ් වුල්ෆ්-

ii. අයුරු, කුමට, අයියෝ, අනිද්දා, නිසා, ගැන, ඒ, සමග, බොහෝ, මෙහි යන නිපාත පද යොදා වාක්‍ය තනන්න.

# 4 උපසර්ග

නිපාත හැරුණු කොට අව්‍යය පදවලට ඇතුළත් අනෙක් පද විශේෂය නම් උපසර්ග යි. උපසර්ග යන පද විග්‍රහයට අනුව 'මුලින් සිට වැළඳ ගැනීම' යනු උපසර්ග යන්නෙහි අර්ථය යි. උපසර්ග පද ඒ හා බැඳෙන නාම පදයට හෝ ක්‍රියාපදයට මුලින් එක් කොට ලියනු ලැබේ.

- දුදන දනා ගිනිපුපුරක් වැනි ය.
- අහස් කුසට නැගි වෙසක් සඳ ලොව එකලු කරමින් සුදිලෙයි.

මෙහි මුල් වැකියේ සඳහන් දුදන යන වචනය සෑදී ඇත්තේ දන යන නාම පදයට මුලින් "දු" යන උපසර්ග පදය එක් වීමෙනි. එවිට "ජන" යන අර්ථය ඇති ''දන'' නාමය දුර්ජන වශයෙන් වෙනස් වෙයි. දෙවන වැකියේ සඳහන් සුදිලෙයි යන වචනය සෑදී ඇත්තේ දිලෙයි යන ක්‍රියා පදයට මුලින් "සු" යන උපසර්ග පදය යෙදීමෙනි. එවිට (වැඩි) මනා දිලිසීමක් පිළිබඳ ව කියවෙයි.

**මේ අයුරින් නාම පදයකට හෝ ක්‍රියා පදයකට මුලින් සිට එහි අර්ථයට බලපෑම් කරන පද උපසර්ග පද යනුවෙන් හැඳින්වේ.**

උපසර්ග පද නාම පදයක හෝ ක්‍රියා පදයක මුලින් යෙදී එහි අර්ථයට ආකාර කිහිපයකින් බලපෑම් කරයි.

| | | |
|---|---|---|
| පදයේ අර්ථය වෙනස් කරයි | වි + ශේෂ | = විශේෂ |
| පදයේ අර්ථය වැඩි කරයි | සු + පිරිසිදු | = සුපිරිසිදු |
| එම අර්ථය ම ලබා දෙයි | ස + තුටු | = සතුටු |

සිදත් සඟරාවේ උපසර්ග 20ක් දක්වා ඇත.

ප පර අව ස අනු
නි දු වි අ අදි සු
අබි පිරි උප අප පස් පිළි
අති පි උ

සංස්කෘත පාලි භාෂාවලින් එක් වූ උපසර්ග ද ඇත.

නිර් දුර් ප්‍ර ප්‍රති දුශ්

අභි සං අධි නිෂ්

පරා

### ක්‍රියාකාරකම 4.1

i. පහත ඡේදයේ ඇති උපසර්ග සහිත පද සියල්ල තෝරා ලියන්න. උපසර්ග වෙන් කොට දක්වන්න.

වන මැදට පිවිසෙත් ම සියොතුන්ගේ ඉමිහිරි නදින් දෙසවන් සුපිණනය වී ගියේ ය. විටක ඒ හඬ අප ව සාදරයෙන් පිළිගන්නට නැගුවාක් මෙන් විය. අහිංසක බවින් සුසැදි මුව රැළ අප අබියස පෙනි පෙනී සිටියේ අපෙන් ඔවුනට හිරිහැරයක් නොවන නිසා ය. වනයේ තැනින් තැන සුපුෂ්පිත පුෂ්පයන්ගේ සුගන්ධයෙන් අප සිත් ප්‍රබෝධවත් විය. කෙමියෙන් ගිලිහුණු රොන් සුන් රැගත් මඳ සුළඟ අපට පවන් සලන්නාක් මෙන් විය. සොබා සොඳුරු මෑණියන්ගේ අපූරු නිර්මාණයක් වූ වනය මෙතරම් අතිසුන්දර බව මෙතුවක් කල් අප නොදැන සිටියේ අප තුළ වූ දුරවබෝධය නිසා දැයි සිතේ.

ii. පරා, අව, අප, අධි, සං, නි, සු, අනු, ප්‍රති, අභි යන උපසර්ග සහිත පද යොදා වාක්‍ය දහයක් නිර්මාණය කරන්න.

# 5 ආඛ්‍යාත පද

වාක්‍යයක ප්‍රධාන කොටස් දෙකකි. උක්තය හා ආඛ්‍යාතය යනු ඒ කොටස් දෙක යි. උක්තය යනු වාක්‍යයේ ක්‍රියාවෙන් කියවෙන තැනැත්තා හෝ දෙය යි. ආඛ්‍යාතය යනු උක්තය විසින් කරනු ලබන ක්‍රියාව යි. එහෙයින් එය අවසාන ක්‍රියා නමින් ද හැඳින්වේ. උක්තය යම් සේවයක් වාක්‍යයකට සලසන්නේ ද, ඊට සමාන සේවයක් ආඛ්‍යාතයෙන් ද සිදු වේ. උක්තයට අනුකූලව පෙනී සිටිමින් කාල, පුරුෂ, වචන නිසි පරිදි ගැළපීමෙන් ආඛ්‍යාතය වාක්‍යයක අදහස පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීමට දායක වන අතර එයට සමාප්ති අර්ථයක් ද ලබාදේ.

පහත දැක්වෙන්නේ සඳසිරිපුර ශ්‍රී ධර්මවර්ධන පාරිවෙණික ශිෂ්‍ය සමිතියේ මාසික සභා වාරයේ කරන ලද සාකච්ඡාවෙන් උපුටා ගත් කොටසකි.

සභාපති හිමි: "න්‍යායපත්‍රානුකූල ව මීළඟට තිබෙන්නේ "නිර්මාණාත්මක ලිපි" ඉදිරිපත් කිරීමේ වාරය යි. ඒ අනුව පළමු නිර්මාණාත්මක ලිපිය ඉදිරිපත් කිරීම සඳහා දෙවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ගැමුණුපුර සාරද ආයුෂ්මතුන්ට ආරාධනා කර සිටිනවා."

ගැමුණුපුර සාරද හිමි: "මුළු සභාවෙන් අවසර යි. මා මේ සභාව ඉදිරියට පැමිණියේ නිර්මාණාත්මක ලිපියක් ඉදිරිපත් කිරීමට යි. එය සාවධාන ව අසා සිටිනු ඇතැ'යි මා බලාපොරොත්තු වෙනවා. මගේ ලිපියේ මාතෘකාව "වසන්කල සිරි විසිතුරු" යන්න යි.

සොබා දහමේ සැබෑ අලංකාරය ලොවට විදහා පාන අසිරිමත් කාලය වසන්ත කාලය යි. ග්‍රීෂ්මයාන උණුසුමින් වියළී ගිය ජීව ලෝකය ම පණ ලබා ගන්නේ වසන්ත කාලයේ දී ය. ගොවි බිමෙන් ශස්‍ය නෙළා ගන්නා මිනිස්සු එහි සතුට විඳිති. ග්‍රීෂ්මයාගේ ආහාර නොමැති ව පීඩා විඳි සිව්පාවෝ සතුටු සිතින් ආහාර සොයා යති. කුල්මත් වූ විහඟුන්ගේ නාදය දසත පැතිරී යයි. සුවඳ විහිදුවමින් පුෂ්පයෝ විකසිත වෙති. පිපුණු පුෂ්පයන්ගේ රොන් උරන්නට ගුමුගුමු නදින් ඔකඳ වූ මී මැසි කැල වේගයෙන් පියඹා එති. මෙසේ සොබා සිරියෙන් අලංකාරවත් වූ වසන්ත කාලය කවරකුගේ නම් නෙත් සිත් පැහැර නොගන්නේ ද? මාගේ ලිපිය කියවා අවසාන යි.

අසා සිටි සියලු දෙනාට ම ස්තුතියි!"

ඉහත ලිපියෙන් උපුටා ගත් මේ වැකි දෙක දෙස බලන්න.

1. සිවුපාවෝ සතුටු සිතින් ආහාර සොයා යති.

2. සුවඳ විහිදුවමින් පුෂ්පයෝ විකසිත වෙති.

මෙහි පළමු වැකියේ සොයා යති යන ක්‍රියාව සිව්පාවුන් විසින් සිදු කරන්නක් බව දක්නට ලැබේ. එය කිරීමකි.

දෙවන වැකියේ විකසිත වෙති යන ක්‍රියාවෙන් පුෂ්පයෝ තමා විසින් ම විකසිත වන බව හැඟවේ. එය ඉබේ ම සිදු වන දෙයකි. මෙසේ සිදු කිරීමක් හෝ සිදු වීමක් හඟවන පද "ආඛ්‍යාත පද" ලෙස හැඳින්වේ.

5.1 ක්‍රියාකාරකම

ඉහත ලිපියේ ඇතුළත්, කිරීමක් සහ සිදු වීමක් හඟවන ආඛ්‍යාත පද ඇති වැකි තෝරා වෙන වෙන ම ලියන්න.

## ආඛ්‍යාත පද සැකසෙන අයුරු:

5.1 ක්‍රියා මූලයකට සමාප්ති සූචක ප්‍රත්‍යයක් එකතු වීමෙන් ආඛ්‍යාත පදයක් සෑදේ.

| ක්‍රියා මූලය | | ප්‍රත්‍ය | | ආඛ්‍යාත පදය |
|---|---|---|---|---|
| කර | + | යි | = | කරයි |
| කර | + | ති | = | කරති |
| කර | + | හි | = | කරහි |
| කර | + | හු | = | කරහු |
| කර | + | මි | = | කරමි |
| කර | + | මු | = | කරමු |

5.2 ක්‍රියාකාරකම

පහත ආඛ්‍යාත පදවල ක්‍රියා මූලය සොයා ලියන්න.

1) ගයති 2) රඟයි 3) දුවයි
4) සරසයි 5) සලමු 6) කොඳුරමි
7) බලති 8) දෙසති 9) කසති 10) දිනමි

### ආඛ්‍යාත පදවල කාල / වචන / පුරුෂ භේදය

වර්තමාන කාලය (ලිය ධාතුව)

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියයි | ලියති |
| මධ්‍යම පුරුෂ | ලියහි | ලියහු |
| උත්තම පුරුෂ | ලියමි | ලියමු |

අතීත කාලය

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලිව්වේ ය | ලිව්වෝ ය |
| මධ්‍යම පුරුෂ | ලිව්වෙහි | ලිව්වෙහු |
| උත්තම පුරුෂ | ලිව්වෙමි | ලිව්වෙමු |

අනාගත කාලය

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියන්නේ ය | ලියන්නෝ ය |
| මධ්‍යම පුරුෂ | ලියන්නෙහි | ලියන්නෙහු |
| උත්තම පුරුෂ | ලියන්නෙමි | ලියන්නෙමු |

5.3 ක්‍රියාකාරකම

පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු ආඛ්‍යාත රූපය තෝරා ලියන්න.
කරති, ගැයුහු, කිව්වෝ ය, ගියෙමු, ලියයි, කරන්නෙමි, පැමිණියේ ය, වඩින්නෝ ය, ගලති, සදන්නෝ ය, ඇදෙති, ගන්නෙහි, උපන්නේ ය, නැටුවෙමි, පිවිසෙයි.

i) ලේඛකයා පොත් ..........................
ii) උපාසක මහතා ඊයේ සවස විහාරයට ......................
iii) රහල් හිමියෝ හෙට දම් දෙසුමකට ........................
iv) පක්ෂීහු නිලඹර අරා පියාසර ........................
v) සියලු නදීහු වක් ව ....................
vi) රුක් වඩුවෝ අලංකාර ලෙස ලී බඩු ......................
vii) බල සේනාව ජය ලබමින් ඉදිරියට ...................
viii) නුඹලා සතුටින් ගීයක් .......................
ix) අපි භෝජන සංග්‍රහයෙන් පසු ව සතුටින් විසිර ......................
x) මම වර්තමානයෙන් අනාගතය කරා ගමන් .................
xi) තෝ වරදෙහි සමාව .....................
xii) මට්ටකුණ්ඩලී දෙව්ලොව .......................

## 5.2 විධි ක්‍රියා

විධානයක් හෝ අණකිරීමක් ප්‍රකාශ කරන ක්‍රියාපද විධික්‍රියා යනුවෙන් හැඳින්වේ.

පැ හැ ස ර ණි ය  මිණි  පැමිණිය  කොත්  අගට
බ ඳ කි කි ණි ය  දද  හිබිණිය  විමන්  වට
නො ව පැ ර ණි ය  වත  රමණිය  විටින්  විට
සැ ළ ලි හි ණි ය  වදු  කැලණිය  පුරවරට

මේ කවියෙන්, කොත් අගට පැමිණි ප්‍රභාවත් මැණික් ඇති, මිණි ගෙඩි බැඳි කොඩිවලින් යුක්ත වූ විමානයන් අවට ඇති, පැරණි නොවී විටින් විට රම්‍ය වන්නා වූ ස්වභාවයෙන් යුත් කැලණිය නම් උතුම් පුරවරයට පිවිසෙන ලෙස සැළලිහිණියාට පවසා ඇත.

මෙය උපුටා ගන්නා ලද්දේ තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් විසින් රචනා කරන ලද සැළලිහිණි සන්දේශයෙනි. මෙහි **<u>පිවිසෙන්න</u>** යන විධානය සිදු කර ඇත්තේ "<u>වදු</u>" යන ක්‍රියාවෙනි. සිංහල භාෂාවේ ඇති එවැනි ක්‍රියා නැතහොත් ආඛ්‍යාත <u>විධි ක්‍රියා</u> යනුවෙන් හැඳින්වේ.

ළඟ සිටින කෙනෙකුට හෝ දුර සිටින කෙනෙකුට හෝ කරනු ලබන විධානය ක්‍රම දෙකකින් කළ හැකි ය.

ආදරයෙන් කරන විධානය
අනාදරයෙන් කරන විධානය

ආදරය ගෞරවය සුහදබව හැඟවෙන සේ කෙරෙන විධානය ආදරයෙන් කරන විධානය යි.

උදා :-
- පුතේ මෙහි එන්න.
- ස්වාමීන් වහන්ස, දානයට වඩින්න.
- මෙහි වාඩි වෙන්න .

කෝපය, තරහව, අප්‍රසාදය, හැඟවෙන සේ කෙරෙන විධානය අනාදරයෙන් කරන විධානය යි.

උදා :-
- මෙතනින් පිට ව යනු
- වහා මා ළඟට එනු

5.3 ක්‍රියාකාරකම

i) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු විධි ක්‍රියා පද යොදන්න.

i) හිස්වැසුම් , පාවහන් ගලවා....................
ii) මෙහි කුණු දමන්න..................
iii) දකුණු පසින් ඉදිරියට............
iv) දුම්බීම......................
v) විහාරස්ථානය තුළ නිශ්ශබ්ද ව ..............
vi) පනින්න පෙර සිතා ..............
vii) දෙව් ලොව යන්න..................
viii) මෙතනින් ඉවතට.....................
xi) සෙමින් රිය.......................
x) කරුණාකර ගමන් මලු පරීක්ෂා කිරීමට...................

ii. පහත සඳහන් පද්‍ය සහ ගීත පාඨවල යෙදී ඇති විධික්‍රියා තෝරා ලියන්න.

(අ) " අන්න බලන් සඳ රන්තැටියෙන් සුදු සීත ගඟුල් ගලනා......."

(ආ) "කරව පියාසර සකි කොන්ත ගං තොටින් "

(ඇ) "අයන්න කියන්න ලොවට ම ඇහෙන්න "

(ඈ) "නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට "

(ඉ) "පිළිගන්න මම ඡන්න ඇමති වෙමි
මා එක්ක ගියෙ ඒයේ සිදුහත් හිමි"

(ඊ) "ජයවද්දන පුරවර දනු මිතුරු තුමා "

(උ) "එන්න මඳ නලේ ගොස් පවසන්න දුක මගේ......."

(ඌ) "සුබ මොහොතින් වැද හස රද එවෙහෙරට "

(එ) "දුවෙ පුතේ දඟ නොකරන් මාගේ "

(ඒ) "බල සුබ නිමිති පෙර මග නැකතටත් වැඩි "

iii. විධි ක්‍රියා පද සහිත වාක්‍ය 5ක් නිර්මාණය කරන්න.

# 6 නෛපාතික කෘදන්ත

ක්‍රියා මූල :-

කාල, පුරුෂ, වචන ආදිය පදනම් කරගෙන ක්‍රියා මූලවලට ප්‍රත්‍ය ගන්වා විවිධ ස්වරූප බවට පත් කළ හැකි ය. ක්‍රියා පද අතර එසේ වෙනස් කළ නොහැකි ක්‍රියා පද වර්ග කිහිපයක් ඇත. වාක්‍යවල නිපාත ස්වරූපයෙන් යෙදෙන එම ක්‍රියා කෘදන්ත නිපාත හෙවත් නෛපාතික කෘදන්ත යනුවෙන් හැඳින්වේ. පහත දැක්වෙන්නේ ඒවා අතුරින් පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා යන වර්ග දෙක යි.

## 6.1 පූර්ව ක්‍රියාව

සිසුවා මවුපියන් වැඳ නිවසින් පිටව යයි.

මේ වාක්‍යයේ අවසාන ක්‍රියාව "පිටව යයි" යන්න යි. එම අවසාන ක්‍රියාවට පෙර සිසුවා විසින් කරන ලද ක්‍රියාවක් මේ වාක්‍යයේ ඇත. ඒ "වැඳ" යන්න යි. ඒ අයුරින් වාක්‍යයක අවසාන ක්‍රියාවට පෙර නිම වූ බව කියවෙන ක්‍රියා "පූර්ව ක්‍රියා" නමින් හැඳින්වේ.

පූර්ව ක්‍රියා යෙදී ඇති මේ වැකි දෙස බලන්න.

i) මව කිරි දී දරුවන් පෝෂණය කරයි.
ii) යාචකයා වාඩි වී කෑම කයි.
iii) මුවා සිංහයාට බිය වී නැතිගෙන දිව්වේ ය.

එක ම වාක්‍යයක පූර්ව ක්‍රියා කිහිපයක් වුව ද යෙදී තිබිය හැකි ය.

උදා :- i) ළමයා උදෙන් අවදි වී දත් මැද මුව සෝද ආහාර අනුභව කරයි.
ii) රන්කරුවා රන් පිරිසිදු කර ආභරණ සාද ඔප දමා මිලට දෙයි.
iii) දුටුගැමුණු රජු වෙහෙර විහාර කරවා වැව් අමුණු කනවා දැහැමි ඔවදන් ලබා රට පාලනය කළේ ය.

6.1 ක්‍රියාකාරකම

i. පහත සඳහන් පද්‍යයේ සහ ගද්‍ය කොටසේ ඇති පූර්ව ක්‍රියා පද තෝරා ලියන්න.

ඔන්න මලේ ඔය නාමල නෙළා වරෙන්
අන්න බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්
කැලණි ගඟේ ඔරු යනවා බලා වරෙන්
සාදුකාර දී ඔරුවක නැගී වරෙන්

"අම්මා මැරෙන විට මගේ වයස අවුරුදු හතකට වැඩි නොවී යයි, මගේ තාත්තාත් සමහර විට කුඩම්මාත් කියනු මා අසා තිබේ. අම්මා මැරුණු දවසේ තාත්තාත් නැන්දත්

තවත් නෑයනුත් හැඬූ සැටි මට මතක් කළ හැකි ය. එද මා හැඬුවේ තාත්තාත් අනිත් නෑයනුත් හඬන්ට වූ බැවිනි. නැන්දා මා වඩා ගෙන මිදුලට බැස මා පරක්කරන විට ගැහැනුන් කිහිප දෙනෙකු "අනේ, අම්මා නැති දරුවා, යි කියමින් මගේ ඔළුව අත ගා මගේ මුහුණ බලා ගිය සැටි තව ම අමතක නොවී ය.

-මඩොල්දූව-

-මාර්ටින් වික්‍රමසිංහ

ii. පූර්ව ක්‍රියා පද සහිත වාක්‍ය දහයක් නිර්මාණය කරන්න.

පැවරුම

පූර්ව ක්‍රියා පද යෙදුණු පුවත්පත් වැකි එකතු කොට අලවා කුඩා පොතක් සාදන්න.

## 6.2 මිශ්‍ර ක්‍රියාව

මිශ්‍ර ක්‍රියා යනු යම් ක්‍රියාවක යෙදෙන අවස්ථාවේ ම තවත් ක්‍රියාවක නිරත වීම යි. මෙහි දී ක්‍රියා දෙක ම එක විට සිදුවේ.

වීරසිංහ ගුරු මහතා නක්කාවිට ගමේ විසූ ගුණවතෙකි. විශ්‍රාම සුවයෙන් පසු වූ ඒ මහතා දිනපතා ම ගමේ විහාරස්ථානයට පැමිණෙයි. විශේෂයෙන් ඔහු විහාරස්ථානයට පැමිණෙන්නේ දිනපතා විහාරස්ථානයට ගෙනෙන පුවත්පත් බැලීමට ය. විහාරස්ථානයට පැමිණෙන සෑම දිනක ම මුලින් ම ඔහු කරන්නේ විහාරයට ගොස් බුදුන් වැඳ විහාරාධිපති ලොකු හාමුදුරුවන් මුණගැසීම ය. ලොකු හාමුදුරුවන් වැඳ ගමේ රටේ තොරතුරු විස්තර ටිකක් උන්වහන්සේ සමග කතා කිරීමට වීරසිංහ ගුරු මහතා අමතක කරන්නේ නැත.



ලොකු හාමුදුරුවන්ගෙන් සමුගන්නා වීරසිංහ මහතා ආවාස ගෙයින් පුවත්පත ද රැගෙන ඊළඟට යන්නේ ධර්මශාලාවට ය. ඒ පුවත්පත බැලීමට ය. ඔහු පුවත්පත බලන්නේ සාමාන්‍ය කෙනෙකු පුවත්පතක් බලන ආකාරයට නොවේ. ඔහුගේ විශේෂත්වයක් ඇත. පුවත්පතේ පිටු දිග හැර දෑතට ගන්නා වීරසිංහ ගුරු මහතා ධර්මශාලාවේ ඒ කොණේ සිට මේ කොනටත් මේ කොණේ සිට ඒ කොනටත් ඇවිදිමින් පුවත්පත බැලීම ඒ විශේෂත්වය යි. විටෙක ඔහු පුවත්පතේ සමහර කොටස් හඬනගමින් කියවීම ද සිදු කරයි.

ඉහත ඡේදයේ දැක්වුණු විස්තරවලට අනුව වීරසිංහ ගුරුමහතාගේ ප්‍රධාන ක්‍රියාව වන්නේ පුවත්පත බැලීම ය. ඔහු ඒ සමග තවත් ක්‍රියාවක් කරයි. ඒ ඇවිදීම ය. ප්‍රධාන ක්‍රියාව සිදු වන අවස්ථාවේ ම තවත් ක්‍රියා සිදු කරන්නේ නම් එවැනි ක්‍රියා මිශ්‍ර ක්‍රියා ලෙස හැඳින්වේ.

ඒ අනුව ඉහත විස්තරය මිශ්‍ර ක්‍රියාව මතු වන සේ එක වැකියකින් ලිවිය හැකි ය.

වීරසිංහ ගුරු මහතා ඇවිදිමින් පුවත්පත බලයි.

මෙහි බලයි යනු අවසන් ක්‍රියාව වන අතර ඇවිදිමින් යන්න මිශ්‍ර ක්‍රියා පදය යි.

**පහත වාක්‍ය දෙස බලන්න.**

i. ගොවියා දහඩිය වගුරුවමින් කුඹුර කොටයි.
ii. නළුවා ගී ගයමින් රඟපායි.
iii. තරුණිය ඉකිබිඳිමින් වැළපුණා ය.

මිශ්‍ර ක්‍රියා සැකසෙන ඉහත ක්‍රමයට අමතර ව පූර්ව ක්‍රියාව දෙවරක් යොදමින් ද මිශ්‍ර ක්‍රියා පද සාදා ගත හැකි ය.

i. නළුවා **ගයගයා** නටයි.
ii. වාදකයා ගී **කියකියා** වයයි.
iii. ළමයා පොත **බලබලා** විෂය කරුණු හදරයි.

6.2 ක්‍රියාකාරකම

i. පහත පද්‍යවල සඳහන් මිශ්‍ර ක්‍රියා පද තෝරා ලියන්න.

කියමින් ගී රස මියුරූ
තබමින් පදතල අනුරූ
බඳිමින් දනමන නුවරූ
කෙළමින් යෙති බැඳ බඹුරූ

කෙළිමින් තැන තැන ලන්දු
දෙන මෙන් තන අම බින්දු
කියමින් සොඳ ගී සින්දු
ඇසුවන් සිත දුක් සින්දු

ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ දෙව්දත් නො දිටි මොක් පුර

ii. මිශ්‍ර ක්‍රියා පද සහිත වාක්‍ය 10ක් ලියන්න.

# 7 විවිධාර්ථවත් පද

ජීව භාෂාවක් යනු නිරන්තර අලුත් පද, අර්ථ එකතු වෙමින් නවීකරණය වන්නකි. එවන් බසක පද (වචන) ඒකීය අර්ථ ප්‍රකාශනවලට සීමා නොවී විවිධාර්ථ පළ කිරීම පිණිස යෙදේ. එක පදයකට අර්ථයෙන් සමාන ව යෙදෙන පද ගණනාවකි. විටෙක එක පදයකට අර්ථ ගණනාවකි. ඇතැම් තැනක එක් පදයකට යෙදෙන විරුද්ධාර්ථ පදයකි. මෙසේ භාෂා ව්‍යවහාරයේ දී නොයෙක් නොයෙක් අර්ථ සහිත ව යෙදෙන පද විවිධාර්ථවත් පද ලෙස හඳුන්වමු. බස හැසිරවීමට එබඳු විවිධාර්ථවත් පද ගැන දැන ගැනීම අත්‍යවශ්‍ය වේ.

**විවිධාර්ථවත් පද**

**සමානාර්ථ පද**

එක ම අර්ථය පැවසීම සඳහා යෙදෙන පද ගණනාවක් ඇති වචනය.

සමානාර්ථ පද

නිදසුන් :

හිරු = සූර්යයා
දිනපති
දිනිසුරු
දිවාකර
දිනමිණි
සහසකර

**බහ්වර්ථ පද**

එක පදයකට අර්ථ කීපයක් ලබා දෙන (බොහෝ අර්ථ ඇති) වචනය.

බහ්වර්ථ පද

ගුරු
ගුරු පුද
ගුරු ග්‍රහයා
ගුරු - ලඝු භේදය
ගුරු පාර ළඟ

* මෙහි ගුරු යන පදය බහු අර්ථවල යෙදේ.

**විරුද්ධාර්ථ පද**

කිසියම් පදයකට විරුද්ධ වූ අර්ථයක් දෙන වචනය.

විරුද්ධාර්ථ පද

මඟුල් - අවමඟුල්
අගාරික - අනගාරික
අර්ථය - අනර්ථය
උසස් - පහත්
දිවා - රාත්‍රි

කියවන්න

හිමි සනරාමර ලෝක සිවංකර
ලොව්තුරු බුදු සමිඳේ
මා හද මැලවෙන මල් දෝතට ගෙන
පාද වඳිමි නිබඳේ

හිමි ගුණ ආකර ලෝක දිවාකර
ලොව්තුරු බුදු සමිඳේ
හිත දුක වාවන බුදු බණ පදයක
මිහිර දකිමි නිබඳේ

හිමි දම් ආකර ගුණ මිණි සාගර
ලොව්තුරු බුදු සමිඳේ
හිත සුවදයක බුදු ගුණ ගීයක
මිහිර විඳිමි නිබඳේ

ගී සංකල්පනා - රඹුකන සිද්ධාර්ථ හිමි



බුදුන් වහන්සේ යන යෙදුමට මෙම ගී සංකල්පනාවේ සමානාර්ථවත් පද රැසක් යොදා ඇත.

හිමි සනරාමර
ලෝක සිවංකර
ගුණ ආකර
ලෝක දිවාකර
දම් ආකර
ගුණමිණි සාගර

} බුදුරජාණන් වහන්සේ

භාෂාවේ පද සඳහා විවිධ සමානාර්ථවත් පද යෙදිය හැකි ය. පද්‍ය හෝ ගද්‍ය ප්‍රකාශනයක එසේ යෙදූ විට එහි අර්ථය අලංකාරත්වයට පත් වේ.

7.1 ක්‍රියාකාරකම


i. "අ" තීරයෙහි දැක්වෙන පදවලට සමානාර්ථවත් පද දෙක බැගින් "ආ" තීරයෙන් තෝරා ලියන්න.

| අ | ආ | |
|---|---|---|
| පන්සල | විහඟ, | තරිඳු , |
| කාන්තාව | අරම, | නිරිඳු, |
| කුරුලු | මුදුන, | සර, |
| රජ | නද | ශෝම්, |
| හඬ | භූපති, | විදුහල, |
| හිස | මග, | සයුර, |
| පාසල | මාවත, | සිප්හල, |
| පාර | රත්නාකරය, | මස්තකය, |
| සඳ | සියොත්, | ආරාමය, |
| මුහුද | මාගම, | ස්ත්‍රිය |

i. ඉහත සඳහන් වචනවලින් කැමති වචන දහයක් යොදා අර්ථවත් වාක්‍ය දහයක් ගොඩනගන්න.

### 7.2 ක්‍රියාකාරකම

i. කුඩා වෘත්තයේ එන පදවලට ගැළපෙන - බහ්වර්ථ පද තුන බැගින් ලොකු වෘත්තයෙන් තෝරා වගුවක යොදන්න




ii. පහත සඳහන් කවියේ තද කළු අකුරු සහිත පද වෙනත් අර්ථ මතුවන සේ යොදා වාක්‍ය 05ක් ගොඩනගන්න

සත් ගුණ යුත් සතන් හට වැඩ කළොත් සරු
අත් පිට දියුණුව ම පල දේ ය නිරතුරු
වත් කළ දිය නෙරළු තුරු මුලට පියකරු
දෙත් මුදුනෙන් පල රස රැගෙන අමයුරු

### 7.3 ක්‍රියාකාරකම

i. "අ" වෘත්තයේ ඇති පදවලට විරුද්ධාර්ථවත් පද "ආ" වෘත්තයෙන් තෝරා ලියන්න.

**අ**

උදය, දකුණ, උසස්, යුක්තිය, උඩ, බටහිර, ලාභය, බාහිර, පව්, දිවා, නින්දා, සභනය, ජය, ගුණ, අර්ථය, ආරම්භය, අගාරික

**ආ**

පරාජය, රාත්‍රී, අගුණ, නැගෙනහිර, අනර්ථය, යට, අභ්‍යන්තර, උතුර, පින්, අවසානය, අයුක්තිය, පහත්, ප්‍රශංසා, අලාභය, අනගාරික, අසහනය, සවස

ii. "අ" තීරයේ ඇති වචනවලට අදාළ විරුද්ධාර්ථ පදය "ආ" තීරයෙන් තෝරා යා කරන්න.

| අ | ආ |
|---|---|
| 1. භය | යශ |
| 2. උත්තීර්ණ | යටිකුරු |
| 3. දියුණු | නිර්භය |
| 4. අයශ | අවතීර්ණ |
| 5. කුටිල | නොදියුණු |
| 6. උඩුකුරු | අකුටිල |

# 8 වාක්‍ය නිර්මාණය

භාෂාවක මූලික කාර්යය වන්නේ අදහස් හුවමාරු කර ගැනීම යි. සාමාන්‍යයෙන් අදහස් හුවමාරු කර ගන්නේ වාක්‍ය මගිනි. වාක්‍යවල නිරවුල් බව අදහස් පැහැදිලි වීමට විශේෂයෙන් බලපායි. වාක්‍යයක් යනු කුමක් ද? නිරවුල් වාක්‍යයක් ලියන්නේ කෙසේ ද? එහි කොටස් මොනවා ද? කර්තෘකාරක, කර්මකාරක වශයෙන් යෙදෙන්නේ කෙසේ ද? යන කරුණු පිළිබඳ ව මේ පාඩමේ දී අවධාරණය කෙරේ.

## 8.1 - වාක්‍යය



**මාර මූබය**

උගුරේ මස් කටුවක් හිරවුණු වෘකයෙක් එය ඉවත් කොට තමා වේදනාවෙන් මිදවීමට පුළුවන් අයෙකු සොයමින් ඇවිද්දේ ය. එසේ යන විට මානකොකෙකු මුණ ගැසී ගාස්තුවක් පොරොන්දු වී කටුව ඇද දමන ලෙස ඉල්ලී ය. මානකොකා ද වෘකයාගේ උගුර දක්වා හිස, කට තුළට රුවා කටුව ඇද දැමී ය. අනතුරුව පොරොන්දු වූ ගාස්තුව ඉල්ලා සිටියේ ය. වෘකයා සිනාසී දත් විලිස්සී ය. "ඇබැද්දියක් නොවී තාගේ හිස එළියට ගත්ත එක මදිදැයි" අසා යන්න ගියේ ය.

ඊසොප්ගේ උපමා කතා

දුෂ්ටයන්ගෙන් බලාපොරොත්තු විය හැකි ලොකු ම උපකාරය ඔවුන්ගේ අසාධාරණයකට ගොදුරු නොවීම බව උපදේශය කොට ගත් මේ රසවත් කතාව ගොඩ නැගී ඇත්තේ, එකිනෙකට සම්බන්ධ අදහස් ඇති වාක්‍ය තුළිනි. කථනයේ දී හෝ ලේඛනයේ දී යම් අදහසක් ඉදිරිපත් කරන්නේ වාක්‍ය භාවිතයෙන් බව පැහැදිලි වේ.

> වාක්‍යය යනු,
> පූර්ණ අදහසක් පැවසෙන පරිදි ගැළපුණු පද සමූහය කි.

මේ වාක්‍ය දෙස බලන්න. ඒවායින් පූර්ණ අදහසක් පළ කරන බව ඔබට වැටහේ.

- ශිෂ්‍යයා පොත පාඩම් කරයි.
- වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.
- අනගාරික ධර්මපාලතුමා බෞද්ධ හඬ අවදි කළේ ය.
- කථානායකතුමා සභා ගැබෙන් පිටතට ගියේ ය.
- ආනන්ද තෙරණුවෝ ධර්මය සුරක්ෂිත කිරීමට උපකාරී වූහ.

## 8.2 වාක්‍යයක කොටස්

- නා හිමියෝ ශිෂ්‍යයන්ට අවවාද දුන්හ.
- මබාදේව රජු වනගත වූයේ ය.

මෙම වාක්‍යවල **"අවවාද දුන්හ"** **"වනගත වූයේ ය"**. යන වාක්‍යාවසාන ක්‍රියා පද ආඛ්‍යාත ලෙස හැඳින්වේ. අවවාද දෙයි යනුවෙන් දක්වූ විට අවවාද දෙන්නේ කවරෙක් ද යන පැනයත්, වනගත වූයේ ය, යනුවෙන් දක්වූ විට වනගත වන්නේ කවරෙක් ද යන පැනයත් මතු වේ. ඊට පිළිතුරු **"නාහිමියෝ"** හා **"මබාදේවරජු"** යන්න ය.

ඒ අනුව වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් කියවෙන පදය උක්තය ලෙස හැඳින්වේ.

උක්තය හා අවසාන ක්‍රියාව වාක්‍යයක ප්‍රධාන කොටස් වේ.

මීට අමතර ව වාක්‍යයක "කර්මය යනුවෙන් කොටසක් ද බොහෝ සෙයින් දකිය හැකි ය. කර්මය යනු උක්තය විසින් කරනු ලබන අවසාන ක්‍රියාවට යටත් වන පදය යි.

"ළමයා පොත පාඩම් කරයි" යන වාක්‍යයේ ළමයා යනු උක්තය යි. පාඩම් කරයි යනු ක්‍රියාව යි. ළමයාගේ පාඩම් කිරීමට යටත් වන්නේ පොත ය. එමනිසා මෙහි පොත යනු "කර්ම" පදය යි. උක්තය, කර්මය, අවසාන ක්‍රියාව ගැළපුණු වාක්‍ය පහත දක්වේ.

| උක්තය | කර්මය | අවසාන ක්‍රියාව |
|---|---|---|
| මිනිසා | ගස | කපයි. |
| සිංහයෝ | මුවන් | මරති. |
| නුඹ | ගමට | යහි. |
| නුඹලා | පොත් | කියවහු. |
| මම | නැටුම | නටමි. |

## 8.3 වාක්‍යයක් නිරවුල් ව ලිවීම

වාක්‍යයක් නිරවුල් ව ලිවීමේ දී උක්තය හා අවසාන ක්‍රියාව (ආඛ්‍යාතය) පුරුෂ වශයෙන් වචන වශයෙන් සමාන විය යුතු ය.

උදහරණ :

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලේඛකයා පොත ලියයි | ලේඛකයෝ පොත් ලියති |
| මධ්‍යම පුරුෂ | නුඹ පොත ලියහි | නුඹලා පොත් ලියහු |
| උත්තම පුරුෂ | මම පොත ලියමි | අපි පොත් ලියමු |

උක්තය හා අවසාන ක්‍රියාව කාල හා ලිංග වශයෙන් බොහෝ තැන්වල සමාන ව ද සමහර තැන්වල අසමාන ව ද යෙදේ.

වර්තමාන කාලය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍ර. පු. - පුරුෂ ලිංග | ශිෂ්‍යයා පොත කියවයි | ශිෂ්‍යයෝ පොත් කියවති. |
| ස්ත්‍රී ලිංග | ශිෂ්‍යාව පොත කියවයි | ශිෂ්‍යාවෝ පොත් කියවති. |
| ම. පු. - පුරුෂ ලිංග | නුඹ පොත කියවහි | නුඹලා පොත් කියවහු. |
| ස්ත්‍රී ලිංග | නුඹ පොත කියවහි | නුඹලා පොත් කියවහු. |
| උ. පු. - පුරුෂ ලිංග | මම පොත කියවමි | අපි පොත් කියවමු. |
| ස්ත්‍රී ලිංග | මම පොත කියවමි | අපි පොත් කියවමු. |

අතීත කාලය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍ර. පු.- පුරුෂ ලිංග | ශිෂ්‍යයා පොත කියවූයේය | ශිෂ්‍යයෝ පොත් කියවූවෝ ය. |
| ස්ත්‍රී ලිංග | ශිෂ්‍යාව පොත කියවූවා ය | ශිෂ්‍යාවෝ පොත් කියවූවෝ ය. |
| ම.පු. - පුරුෂ ලිංග | නුඹ පොත කියවීහි | නුඹලා පොත් කියවීහු. |
| ස්ත්‍රී ලිංග | නුඹ පොත කියවීහි | නුඹලා පොත් කියවීහු. |
| උ.පු. - පුරුෂ ලිංග | මම පොත කියවීමි | අපි පොත් කියවීමු. |
| ස්ත්‍රී ලිංග | මම පොත කියවීමි | අපි පොත් කියවීමු. |

අනාගත කාලය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍ර.පු. - පුරුෂ ලිංග | ශිෂ්‍යයා පොත කියවන්නේ ය | ශිෂ්‍යයෝ පොත් කියවන්නෝ ය. |
| ස්ත්‍රී ලිංග | ශිෂ්‍යාව පොත කියවන්නී ය | ශිෂ්‍යාවෝ පොත් කියවන්නෝ ය. |
| ම.පු. - පුරුෂ ලිංග | නුඹ පොත කියවන්නෙහි | නුඹලා පොත් කියවන්නහු. |
| ස්ත්‍රී ලිංග | නුඹ පොත කියවන්නෙහි | නුඹලා පොත් කියවන්නහු. |
| උ.පු. - පුරුෂ ලිංග | මම පොත කියවන්නෙමි | අපි පොත් කියවන්නෙමු. |
| ස්ත්‍රී ලිංග | මම පොත කියවන්නෙමි | අපි පොත් කියවන්නෙමු. |

## විශේෂ රීතියක්

අප්‍රාණවාචී නාම පදයක් ඒක වචන හෝ බහු වචන උක්තයක් ලෙස යෙදුණ වාක්‍යවල අවසාන ක්‍රියාව ඒක වචනයෙන් ම තැබීම විශේෂ යි.

උදා:-

| **ඒක වචන** | **බහු වචන** |
|---|---|
| අත්ත සෙලවෙයි | අතු සෙලවෙයි |
| මල පිපෙයි | මල් පිපෙයි |
| ගස වැටෙයි | ගස් වැටෙයි |
| තරුව බැබළුණේ ය | තරු බැබළුණේ ය |

### ක්‍රියාකාරකම 8.1

සුදුසු ක්‍රියා පදය තෝරා පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවන්න.

නටති, නැටුවෙමු, වෙසෙති, කළා ය, පිරිනැමී ය, කළහ, කළා ය, වැඩිය හ, බොයි, පත් වූවා ය, වූවෝ ය, පත් වූයේ ය

1. සමනලයා මල් පැණි ....................................................................................
2. ගෙවිලිය ඇඹුල පිළියෙල ..............................................................................
3. නැට්ටුවෝ නැටුම් ......................................................................................
4. උපාසිකාවෝ සිල් සමාදන් ............................................................................
5. පොළෝ තලයෙහි බොහෝ ජීවීහු ....................................................................
6. විශාඛාව ආරාමයක් කොට පූජා ......................................................................
7. දෙව්රම් වෙහෙරේ විසූ බොහෝ භික්ෂූහු දනට .................................................
8. දෙවිවරු බුදුවීම සඳහා බෝසතුන්ට ඇරයුම් ....................................................
9. වෙසතුරු තිරිඳා බුදුබව පතා මහදන්.............................................................
10. දික්තලා නිසා කාළුගෝළයා ශෝකයට............................................................

## 8.4 සරල හා සංකීර්ණ වාක්‍ය

**1. <u>මම</u> <u>බුදුන්</u> <u>වඳිමි.</u> 2. <u>අපි</u> <u>පන්සල්</u> <u>ගියෙමු.</u> 3. <u>රියදුරා</u> <u>රථය</u> <u>පදවයි.</u>**

ඉහතින් දක්වෙන්නේ උක්තය කර්මය ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය තුනකි.

ළමයා නිදයි. ගඟ ගලයි.
දරිය හඬයි. සඳ පායයි.

යන වාක්‍ය කර්මය රහිත සරල වාක්‍යයන් අතරට ගැනේ. උක්ත විශේෂණ, කර්ම විශේෂණ, ක්‍රියා විශේෂණවලින් ද යුක්ත අප්‍රධාන වාක්‍ය එකක් හෝ වැඩි ගණනක් ඇතුළත් ප්‍රධාන වාක්‍ය වේ නම් එවැනි වාක්‍ය සංකීර්ණ වාක්‍ය ලෙස හැඳින්වේ.

- ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් වේගයෙන් ලකුණු රැස් කරද්දී, ක්‍රීඩා ලෝලීහු ඔල්වරසන් දුන්හ.
- පදිකයන්ගේ කෑගැසීමෙන් අවදි වූ ආරක්ෂකයන් ඒ මේ අත දුවන විට, සොරු සැඟවී ගියහ.
- ශ්‍රී ලාංකිකයන් ආහාර ගැටලුවට සාර්ථක ලෙස මුහුණ දෙති'යි විෂය භාර ඇමතිතුමා සිය දේශනයේ දී ප්‍රකාශ කළේ ය.

### ක්‍රියාකාරකම 8.2

උක්තය, කර්මය, ආඛ්‍යාතය සහිත සංකීර්ණ වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

## 8.5 කර්තෘ කාරක වාක්‍ය




දඹුලු විහාරයට යන මග දෙපස එල්ලා තිබෙනු දැකිය හැකි මේ දැන්වීම් පුවරුවේ සඳහන් වන්නේ උක්තය, කර්මය, අවසාන ක්‍රියාව සහිත වාක්‍යයකි. මෙහි ''සපා කති'' යන ක්‍රියාව කරන්නේ "රිලවු" ය, ''රිලවු'' යනු මෙම වාක්‍යයේ කර්තෘ ය. සපා කති යන ක්‍රියාවෙන් කියවෙනුයේ (උක්ත වන්නේ) ''රිලවු'' වන නිසා මෙහි උක්තය වී ඇත්තේ කර්තෘ ය. ඒ අනුව කර්තෘ උක්ත වන වාක්‍ය කර්තෘකාරක වාක්‍ය යි.

උදා:-

- නිවේදකයා සභාව අමතයි.
- ගොපල්ලෝ ගවයන් බඳිති.
- ඔබ මුදල් එකතු කළෙහි.
- නුඹලා ව්‍යාපෘතිය නිම කරහු.
- මම සෑ මළුවට ගියෙමි.
- අපි පූජාවට සහභාගි වෙමු.
- විජය තම්මැන්නාවට ගොඩ බැස්සේ ය.
- ඔවුහු සටන දිනූ හ.

## 8.6 කර්ම කාරක වාක්‍ය










මෙවැනි දැන්වීම් මග තොටේ දී නිතර ම දක්නට ඇත. ඒ හැම පුවරුවක ම ඇත්තේ වාක්‍යයකි. පූර්ණ අදහසක් ප්‍රකට කරන වාක්‍යයකි. එහෙත් එම වාක්‍යවල ක්‍රියාව කරන්නෙක් හෙවත් කර්තෘ කෙනෙක් දක්වා නැත. ඒ කර්තෘ ප්‍රධාන නොවන නිසා ය. ප්‍රධාන වී ඇත්තේ ක්‍රියාවට යටත් වන කර්මය යි.

මෙහි 'කුෂන් වැඩ කරනු ලැබේ' යන වාක්‍යයේ කිරීමට මූලික වන්නේ කුෂන් වැඩ ය. කුෂන් වැඩ කරන කෙනෙකු සිටිය හැකි ය. එහෙත් ඔහු වැදගත් වන්නේ නැත. ඒ ආකාරයට කර්මය ප්‍රධාන වන, කර්මය උක්ත වන වාක්‍යය කර්ම කාරක වාක්‍යය යි.

## කර්තෘ කාරක වාක්‍යයක් කර්ම කාරක වාක්‍යයක් බවට හැරවීමේ දී සිදු වන වෙනස්කම්




කර්තෘ කාරක වාක්‍ය කිහිපයක් කර්ම කාරක බවට පත් කරන අයුරු පහත දක්වේ.

| කර්තෘ කාරක වාක්‍ය | කර්ම කාරක වාක්‍ය |
|---|---|
| 1. භික්ෂුව දයකයා දැනුම්වත් කරයි. | භික්ෂුව විසින් දයකයා දැනුම්වත් කෙරේ/කරනු ලැබේ. |
| 2. ස්වාමීහු සේවකයන් සනසති. | ස්වාමීන් විසින් සේවකයෝ සනසනු ලැබෙති/සැනසෙති. |
| 3. ඇය මා රිදවයි. | ඈ විසින් මම රිදවෙමි/රිදවනු ලැබෙමි. |
| 4. මම ඔහු ඇමතුවෙමි. | මා විසින් ඔහු අමතන ලදි. |
| 5. ලේඛකයෝ අප පුබුදුවති. | ලේඛකයන් විසින් අපි පුබුදුවනු ලැබෙමු/පිබිද වෙමු. |

ක්‍රියාකාරකම 8.3

(i) මෙම කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

1. ධර්මය දත්තා මරුවා පරදයි.
2. දරුවා මව සැනසුවේ ය.
3. අකාරුණිකයෝ සතුන් පෙළති.
4. මම ගුරුන් පුදමි.
5. සතුරෝ අප වනසති.

(ii) පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න

1. අජාසත්ත රජතුමා බුදුන් ............................................................ .
2. ............................................................ මුවෝ මරනු ලැබෙති.
3. බුදුන් විසින් මාතෘ දිව්‍ය පුත්‍රයා ............................................................ .
4. මද්‍රි දේවිය ජාලිය - ක්‍රිෂ්ණජිනා ............................................................ .
5. පුණ්ණ තෙරුන් විසින් සුනාපරන්ත වැසියෝ ..................................... .
6. ............................................................ පුතුන් රකියි .
7. ශිෂ්‍යයන් විසින් ගුරුවරු ............................................................ .
8. අධ්‍යක්ෂවරයා විසින් ............................................................ අමතනු ලැබූ හ.
9. ............................................ ඔහුට මෛත්‍රී කරමි.
10. අහසේ තරු ............................................................ .

# 9 රචනය

ඉගෙනුම් ක්‍රියාවලිය අවසානයේ දී ඉගෙනුම් ඵල අප තුළ කෙතරම් දුරට පිහිටා ඇත්දැයි මැන බලන ක්‍රම රාශියකි. ඒ අතර විශ්ලේෂණය යනු එකකි. ඉන් අදහස් කෙරෙන්නේ යමක් වෙන් කර දැක්වීම, විස්තර කිරීම, බෙදා දැක්වීම ආදිය යි. භාෂාවක් ඉගෙනීමේ දී අප තුළ ඒ හැකියාව (නිපුණතාව) පවතී දැයි සොයා බලන්නේ වාක්‍ය රචනයෙනි. විෂය නිර්දේශයට අනුව වාක්‍ය රචනාවක් යනු කුමක්දැයි හඳුනා ගැනීම මේ පාඩමෙන් අපේක්ෂිත ය.

## 9.1 වාක්‍ය රචනය



කරතොට ශ්‍රී සුචරිතෝදය පිරිවෙනේ දෙවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුනීත පොඩි හාමුදුරුවෝ පන්තියේ වැඩවලට හරිම දක්ෂ ය; කැප වෙලා වැඩ කරනවා. සුනීත පොඩි හාමුදුරුවන්ගේ තිබෙන එක විශේෂ දෙයක් තමයි, පසුවදාට තිබෙන පාඩම් පිළිබඳ ව කලින් දවසේ සූදානම් වෙලා යන එක. එද සුනීත පොඩි හාමුදුරුවෝ පිරිවෙනේ සිංහල උගන්වන සෝමරතන හාමුදුරුවන්ගේ කුටියට වැඩියේ වාක්‍ය රචනය පිළිබඳ කරුණු දැනගෙන එන්න.

සෝමරතන හාමුදුරුවෝ හමුවුණු සුනීත පොඩි හාමුදුරුවෝ පාද නමස්කාර කරලා එකත් පසෙක වී වාක්‍ය රචනය පිළිබඳ තොරතුරු අහන්න පටන් ගත්තා.

" හාමුදුරුවනේ වාක්‍යය රචනයක් කියන්නේ මොකක් ද?"

ඒ සුනීත පොඩි හාමුදුරුවන්ගේ පළමු ප්‍රශ්නය .

" පොඩි නම, රචනය කියන එකේ තේරුම විසිතුරු ලෙස ගැළපීම කියන එකයි. වාක්‍ය රචනාවත් විසිතුරු ලෙස ගැළපීමක්. භාෂාව යොදා ගෙන අදහස් විසිතුරු ලෙස ගැළපීමෙන් වාක්‍ය රචනයක් ලියන්න පුළුවන්".

" හාමුදුරුවනේ වාක්‍ය රචනා කියන එකේ තේරුම නම් දැන ගත්තා. ඒ ගැන තවත් ටිකක් විස්තර කරලා දෙනව ද"?

"ඔව් පොඩිනම වාක්‍ය රචනාවකින් කෙරෙන්නේ.................

කිසියම් මාතෘකාවකට අනුව භාෂාව යොදා ගෙන අදහස් සමූහයක් මනාව ඉදිරිපත් කිරීම යි.

එහි දී අනුගමනය කළ යුතු රටාවක් තිබෙනවා මෙන්න මෙහෙම.................

- පළමු ව මාතෘකාව කියවා තේරුම් ගැනීම.
- මාතෘකාවට අදාළ කරුණු ප්‍රමාණවත් ලෙස ගොනු කර ගැනීම.
- අනුපිළිවෙළට කරුණු ඉදිරිපත් කිරීම.
- කරුණු පැහැදිලි ව ඉදිරිපත් කිරීම.
- සුදුසු භාෂා විලාසයකින් අදහස් නිවැරදි ව, අලංකාරවත් ව ඉදිරිපත් කිරීම.



" පොඩිනම් වාක්‍ය රචනාවක් ලිවීමේ දී මේ කරුණුවලට අමතර ව පහත කරුණු ගැන ද සැලකිලිමත් විය යුතු වෙනවා".

" ඒ මොනවා ද අපේ හාමුදුරුවනේ"?

නිවැරදි අකුරු නිවැරදි තැන ලිවීම වාක්‍යය රචනයක වැදගත් කාරණයක්. අක්ෂර වින්‍යාසය කියන්නේ ඒකට. එහි දී අකුරු පැහැදිලි ලෙස ලිවීම ද වැදගත් වෙනවා. නැතිනම් රචනය බලන, කියවන කෙනාට එය අපහසු වෙනවා.

ඒ වගේ ම හරියාකාර ව පද වෙන් කිරීම, විරාම ලකුණු යෙදීම, ඡේද වෙන් කිරීම, වැනි දේ ද රචනයක තිබිය යුතු වෙනවා.

මේ රචනා හඳුන්වන්නේ වාක්‍ය රචනා කියලනේ. ඒ නිසා උක්තය  ආඛ්‍යාතය ගැළපුණු වාක්‍ය, රචනය පුරා ම ලිවීම වැදගත්.

මේ සියලු තොරතුරු අහගෙන සිටිය සුනීත පොඩි හාමුදුරුවෝ රචනය ගැන තවත් ප්‍රශ්න අහන්න පටන් ගත්තා.

"හාමුදුරුවනේ අපි මේ ලියන රචනාවලට කොටස් තිබෙනවා ද"?.

"ඔව් පොඩිනම, රචනාවක් ප්‍රධාන කොටස් තුනකට බෙදෙනවා". ඒ තමයි,

- ආරම්භය.
- අන්තර්ගතය.
- අවසානය.

ආරම්භය කොටසින් සිද්ධ වෙන්නේ මාතෘකාව හැඳින්වීම යි. රචනයක මධ්‍ය

කොටස හෙවත් ස්කන්ධය වැදගත් ම කොටස යි. රචනයේ අන්තර්ගතය යන්නෙන් අදහස් කරන්නේ මෙම කොටස යි.

එහි දී කෙරෙන්නේ මාතෘකාවට අනුව කරුණු විස්තර කර දක්වීම යි. මේ සඳහා මාතෘකාවට අනුව හොඳින් දැනුම ලබා ගෙන තිබීම වැදගත්. පොත පත කියවීමෙන්, අසා දැන ගැනීමෙන් හෝ විවිධ ක්‍රමවලින් දැනුම ලබා ගත යුතු වෙනවා.

"රචනාවක් අවසාන කරන්නේ මාතෘකාව ගැන තමන් දරන අදහසකිනි.''

"හාමුදුරුවනේ රචනාව ගැන අපි දැන ගත යුතු වන්නේ ඔය තොරතුරු ටික විතර ද"?

" නෑ පොඩිනම රචනාවක් ලිවීමට පෙර තමන් තෝරා ගත් මාතෘකාවට අනුව සැකිල්ලක් හදා ගන්න ඕනැ. එතකොට කරුණු පිළිවෙළකට ලියන්න පුළුවන්. පහත දැක්වෙන්නේ "මවුපිය උපස්ථානය" යන මාතෘකාවට අනුව රචනා සැකිල්ලක් හදාගන්නා ආකාරය යි.

**මවුපිය උපස්ථානය**

- මවුපියෝ නම් කවරහු ද?
- ඔවුන් අප වෙනුවෙන් කළ කැප කිරීම කවරාකාර ද?
- ඔවුන්ට උපස්ථාන කරන්නේ කෙසේ ද?
- මවුපියන්ට උපස්ථාන කිරීමෙන් දරුවන් සමාජයේ පිළිගැනෙනසුලු පිරිසක් වන අයුරු.

මවුපිය උපස්ථානය යන මාතෘකාවට මේ ආකාරයට රචනා සැකිල්ලක් සකස් කර ගත යුතු බව පැවසූ සෝමරතන හාමුදුරුවෝ වාඩි වී සිටි ආසනයෙන් නැගිට උන්වහන්සේගේ කුටියට වැඩම කළා. නැවත සුනීත පොඩිහාමුදුරුවන් ඉදිරියේ පෙනී සිටි උන්වහන්සේ සුනීත පොඩි හාමුදුරුවන්ට පිටුවක් පුරා ලියන ලද කොළයක් දුන්නා.

" සුනීත පොඩිනම මේ තියෙන්නේ ගිය අවුරුද්දේ දෙවෙනි පන්තියේ හිටිය විද්‍යානන්ද පොඩිනම මවුපිය උපස්ථානය ගැන ලියපු වාක්‍ය රචනයක්, කියවල බලන්නකො....................

ඒ උන්නාන්සේ ගිය අවුරුද්දේ සමස්ත ලංකා රචනා තරගයෙනුත් පළමුවෙනියා වුණා."

## මවුපිය උපස්ථානය

නිවසේ දෙවියන්, දෙගුරුන් යන නම්වලින් මවුපියෝ හැඳින්වෙති.හිරු උදවන්නේ නැගෙනහිර දිසාවෙනි. නැගෙනහිරින් හිරු උදවෙත් ම ලෝකය ආලෝකවත් වෙයි. දෙමවුපියන් නිසා දරුවන්ගේ ලෝකය ද ආලෝකවත් වෙයි. ඒ නිසා අප බුදුරජාණන් වහන්සේ මවුපියන් හැඳින්වීමට පෙරදිග නැතහොත් නැගෙනහිර දිසාව යන නම යෙදූහ.

දරුවකු මවුකුස පිළිසිඳ ගත් ද සිට දස මසක් කුස තුළ දරාගෙන මෙලොවට බිහි කිරීමට මවක දරන වෙහෙස වචනවලින් කියා නිම කළ නොහැකි ය. ලොව පුදුමයට පත් කරවමින් රතු ලේ සුදට හරවා දරුවාට පෙවීම තුළින් මවගේ ආදරය පතුරවයි. මව මෙන් ම පියා ද දරුවාගේ ජීවිතය සැපවත් කරන්නට අසීමිත වෙහෙසක් දරයි. දහදිය වගුරුවමින් දරුවන් පෝෂණය කරන්නට, රැකගන්නට පියා සිය ජීවිතය ම කැප කරයි.

මවත් පියාත් එක් වී අව්වැසි, දුක් පීඩා, කම්කටොලු සියල්ල ඉවසමින් දරුවන්ගේ ලෝකය බබළවන්නට වෙහෙසෙන්නේ කිසිදු ලාභ ප්‍රයෝජනයක් බලාගෙන නොවේ.

මේ ආකාරයෙන් දරුවන් වෙනුවෙන් කැප වූ මවුපියන්ට අප ද යුතුකම් ඉටු කළ යුතු යි. ඒ සඳහා ඔවුන් වයසට යන කල් ම සිටිය යුතු නැත. කීකරු ව මැනවින් ඉගෙන ගැනීම ඔවුන්ට කළ හැකි උපස්ථානයක් වන අතර ඔවුන් වයසට ගිය විට ආහාරපාන ආදිය ලබා දී ආදරයෙන් රැක බලා ගැනීම ඔවුන්ට කළ හැකි හොඳ ම උපස්ථානය යි. මවුපිය උපස්ථානය උතුම් මංගල කරුණක් බව බුදුන් වහන්සේ මංගල සූත්‍රයේ දී දේශනා කළහ.

එපමණක් නොව හොඳින් ඉගෙන ගෙන ගුණ නුවණින් යුක්ත ව ලොවට වැඩදායී දරුවන් වීම, තම රට ජාතිය ආගම ආරක්ෂා වන අයුරින් ජීවත් වීම, දෙමාපිය දයාදයන් විනාශ නොකර අර්ථවත් ව පරිහරණය කරමින් කටයුතු කිරීම යනාදිය දරුවකුට තම මවුපියන් වෙනුවෙන් උපස්ථාන කළ හැකි කදිම පිළිවෙළකි.

මෙසේ මවුපියන්ට උපස්ථාන කරන දරුවන් සමාජයේ පිරිහීමට පත් වන්නේ නැත. ඔවුහු සමාජයේ ප්‍රශංසාවට පත් වෙති. දරුවන් අතර ඔවුහු සතුටින් කල් ගෙවති.

**අපිත් අපේ මවුපියන්ට ඉහත කී ලෙසින් උපස්ථාන කරන දරුවෝ වෙමු.**

සෝමරතන හාමුදුරුවන්ගෙන් මේ රචනය දැතින් ලබා ගත් සුනීත පොඩි හාමුදුරුවන් උන්වහන්සේට වැඳ අවසර ගෙන නැවතත් පිරිවෙනට වැඩියේ පසුව ද පන්තියේ දී ඉගෙනීමට තිබෙන වාක්‍ය රචනය පිළිබඳ පාඩම ගැන කරුණු රාශියක් අවබෝධ කරගනිමිනි.

ක්‍රියාකාරකම 9.1

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) "වාක්‍ය රචනාව" යන්නෙහි තේරුම කෙටියෙන් දක්වන්න

ii) වාක්‍ය රචනයක් ලිවීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙළ වර්ගගත කරන්න.

iii) හොඳ රචනයක තිබිය යුතු තවත් කරුණු ලෙස මෙහි දක්වා ඇත්තේ මොනවා ද ?

iv) රචනයක කොටස් තුන නම් කරන්න.

v) රචනයක සැකිල්ල යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

vi) විද්‍යානන්ද පොඩි හාමුදුරුවන්ගේ රචනයේ දක්නට ඇති "මවුපිය උපස්ථානය සඳහා" කඳිම පිළිවෙළ යනු කුමක්ද ?

ක්‍රියාකාරකම 9.2

i) පහත සඳහන් මාතෘකා අනුව රචනා ලිවීම සඳහා සැකිලි පිළියෙල කරන්න.

1. දුටුගැමුණු රජතුමා.
2. පොංගල් උත්සවය.
3. කළගුණ සැලකීම.
4. මා දුම්රියේ ගිය පළමු දවස.
5. සිංහල අවුරුදු සිරිත්.

ii) පහත සඳහන් මාතෘකා යටතේ වාක්‍ය රචනා ලියන්න.

1. ඇසළ පෙරහර.
2. බුදුහාමුදුරුවෝ.
3. යහපත් මිතුරු ඇසුර.
4. මා පැවිදි වූ ද.
5. වැඩිහිටියන්ට සලකමු.

# 10 සාරාංශකරණය

ලේඛනයක, ලිපියක, කථාවක, ඡේදයක, වාර්තාවක සාරවත් නැතහොත් හරවත් ම කොටස සාරාංශය ලෙස හැඳින්විය හැකි ය. වචන රැසකින් යුක්ත පාඨයක ප්‍රධාන අර්ථය ගිලිහී නොයන සේ හකුළුවා ලිවීම සාරාංශකරණය නම් වේ. ඇසීමෙන්, දැකීමෙන්, කියවීමෙන්, විඳීමෙන් අප ලබන සියලු අත්දැකීම් අන් අයට පැවසීමේ දී ඔවුනට ඉතා පහසුවෙන් අවබෝධ වන ලෙස සිදු කිරීමට හැකි නම් එය ඉතා අගනේ ය. සාරවත් දෑ සෑම විට ම වටිනාකමින් ඉහළ නිසා අන් අයට තම අදහස ප්‍රකාශ කිරීමේ දී සමස්ත අර්ථය ඉස්මතු වන සේ කැටි කොට හරවත් දෑ පමණක් දැක්වීම ඉතාම සුදුසු ය. ලේඛන ව්‍යවහාරයේ දී වාක්‍ය අලංකාර කිරීම සඳහා බාහිර සැරසිලි නිතර භාවිත කරනු ලැබේ. ඒවා අර්ථාලංකාර හා ශබ්දලංකාර යනුවෙන් දෙවැදෑරුම් වේ. එහෙත් සාරාංශකරණයේ දී සියලු බාහිර සැරසිලි ඉවත් කොට එහි මුඛ්‍යාර්ථයට ප්‍රධානත්වය දීම විශේෂ ලක්ෂණයකි. සාරාංශකරණයේ මූලික ක්‍රම ශිල්ප දැන ගැනීම ප්‍රයෝජනවත් වේ. සාරාංශය සෑම විට ම තමාගේ ම නිර්මාණයක් වීම සුදුසු ය.

පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න



සිංහලයාගේ ජන ජීවිතය සමග විවිධ උත්සව සම්බන්ධ වේ. එකී සෑම උත්සවයක දී ම බුලතට වැදගත් ස්ථානයක් හිමි වේ. මංගල අවමංගල උත්සවවල දී පමණක් නොව වැඩිහිටියන්, ගුරුවරුන්, භික්ෂූන් පිදීමේ දී බුලත් භාවිත වනු පෙනේ. සිංහල සංස්කෘතියෙහි පමණක් නොව ඉන්දියාව, බුරුමය, පාකිස්ථානය, බංගලාදේශය යන වෙනත් රටවල ද බුලත්විට කෑමට පමණක් නොව වෙනත් විවිධ අවස්ථාවල දී ද එය භාවිත කරයි. මෙහි දී අපගේ අවධානය යොමු වනු ලබන්නේ සිංහල සමාජය හා බුලත් අතර ඇති සම්බන්ධය පිළිබඳ කෙටි සමාජ විද්‍යාත්මක විමසුමක් කිරීමට ය. එම සාකච්ඡාවෙන් සිංහල සමාජයේ බුලත යනු විට කෑමට ගන්නා කොළ විශේෂයක් පමණක් නොව ඊට වඩා ගැඹුරින් අර්ථ ගෙන දෙන දෙයක් බව පෙන්නුම් කෙරේ.

ශ්‍රී ලංකා සමාජය පිළිබඳ විමසුමක්.
එන්. වී. ජී. ඒ. හේමන්ත කුමාර.

ඉහත ඡේදය 1/3ක් වන සේ සාරාංශ කළ විට පහත සඳහන් වන සේ ලියා දැක්විය හැකි ය.



සිංහලයන්ගේ විවිධ උත්සවවල දීත්, සාම්ප්‍රදායික චාරිත්‍රවල දීත් බුලත් භාවිත කරනු සුලබ ව දැකිය හැක. බුලත් ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියාතික රටවල සංස්කෘතියේ සංකේතයකි. සිංහල සමාජය හා බුලත් අතර සම්බන්ධය සමාජ විද්‍යාත්මක ව විමසා බලන විට පැහැදිලි වන්නේ බුලත් විට කෑමට ගන්නා කොළ විශේෂයක් පමණක් නොවන බව යි.

මුලින් සඳහන් ඡේදය පාඨකයා විසින් කියවීමේ දී එහි අන්තර්ගත මූලිකාර්ථය වඩා හරවත් ව ඉදිරිපත් කිරීමට ලේඛනය හසුරුවාගෙන තිබේ. ඒ සඳහා ලේඛකයා වචන රැසක් යොදා ගෙන ඇත. ලේඛන ව්‍යවහාරයේ දී යොදා ගන්නා උපමා, රූපක වැනි අලංකාර, විශේෂණ, පුනරුක්ත, උදාහරණ, නිපාත වැනි දෑ භාවිතයෙන් මුල් ඡේදය සැරසිලි කර ඇති බව පෙනේ.

මුල් ඡේදයේ අදහස රැගෙන ඊට හානියක් නොවන සේ පසු ව ලියා ඇති ඡේදය එකී ඡේදයේ සාරාංශයකි. එනම් මුල් ඡේදයේ මූලිකාර්ථය පමණක් රැගෙන හකුළුවා ලිවීමකි. දෙවන වර ලියා ඇති ඡේදයෙන් ද මුල් ඡේදයේ අදහස ඉස්මතු ව පෙනේ. අදහස අලංකාර කිරීම සඳහා භාවිත කළ සැරසිලි දෙවන ඡේදයේ නොමැත. එසේ ඉවත් කිරීමෙන් ඡේදයේ මූලිකාර්ථයට හානියක් නොවන සේ සංක්ෂිප්ත ව අදහස් ඉදිරිපත් කිරීම සාරාංශකරණය නම් වේ.

ට්‍රිං ට්‍රිං ට්‍රිං 

සමිත පොඩි හාමුදුරුවෝ :- තෙරුවන් සරණයි !

උදිත පොඩි හාමුදුරුවෝ :- තෙරුවන් සරණයි! මම උදිත පොඩි හාමුදුරුවෝ කථා කරන්නේ. මට සමිත පොඩි හාමුදුරුවන්ට කථා කරන්න පුලුවන් ද ?

සමිත පොඩි හාමුදුරුවෝ :- මේ කථාකරන්නේ සමිත පොඩි හාමුදුරුවෝ තමයි.

උදිත පොඩි හාමුදුරුවෝ :- මට අද පිරිවෙනට වඩින්න බැරි වුණා. තරමක අසනීප ගතියක් නිසා. ඔබ වහන්සේ පිරිවෙනට වැඩියා ද?

සමිත පොඩි හාමුදුරුවෝ :- ඔව්; මම අද පිරිවෙන් වැඩියා. මමත් කල්පනා කළා, මොකද අද ඔබවහන්සේ පිරිවෙනට වැඩියෙ නැත්තෙ කියලා. දැන් කොහොමද අසනීපය? බෙහෙත් ගත්තා ද?

උදිත පොඩි හාමුදුරුවෝ :- ලොකු හාමුදුරුවො එක්ක ගිහින් බෙහෙත් ගත්තා. ඒත් තවම ඇඟට පණ නැහැ. මම කතා කළේ උදව්වක් ඉල්ලන්න.

සමිත පොඩි හාමුදුරුවෝ :- කියන්න පොඩි හාමුදුරුවනේ, මට පුළුවන් වෙයි ඔබ වහන්සේට උදවු කරන්න.

උදිත පොඩි හාමුදුරුවෝ :- අසනීප ගතිය අඩු උණොත් මට හෙට පිරිවෙන් වඩින්න පුළුවන් වෙයි. නමුත් හෙට කරගෙන එන්න කියලා දුන්න වැඩ මොනවාද කියලා මම දන්නැහැනෙ. ඒ නිසා කරගෙන එන්න කියලා දුන්න වැඩ ටික මට කියන්න පුළුවන් ද?

සමිත පොඩි හාමුදුරුවෝ :- ආ ! ඒක සුළු උදව්වක්නෙ. මම කියන්නම්. නමුත් දුරකථනයෙන් කියන්න ගියොත් වැඩි වෙලාවක් ගත වේවි.

| | | |
|---|---|---|
| උදිත පොඩි හාමුදුරුවෝ | :- | ඒකත් ඇත්ත තමයි. එහෙනම් මම අපේ පන්සලේ ඉන්න සියාතු මාමාව එවන්න ද? |
| සමිත පොඩි හාමුදුරුවෝ | :- | ඒකනම් හොඳයි. මම සියාතු මාමා අතේ සියලු විස්තර එවන්නම්. සියාතු මාමා එවන විට ගිය සතියේ ඔබ වහන්සේ මගෙන් බලන්න ඉල්ලාගත්ත බුදුගුණ අලංකාරය පොතත් එවන්න. |
| උදිත පොඩි හාමුදුරුවෝ | :- | හොඳයි. මම ඒ පොත එවන්නම්. එහෙනම් ඔබ වහන්සේට තෙරුවන් සරණයි! මම නවතින්නම්. |
| සමිත පොඩි හාමුදුරුවෝ | :- | ඔබ වහන්සේටත් තෙරුවන් සරණයි! |

වර්තමානයේ අදහස් හුවමාරු කර ගැනීමේ දී නවීන තාක්ෂණ මෙවලමක් වන දූරකථන භාවිතය සුලබ ව දක්‍ක ගත හැකි ය. එහි දී අනවශ්‍ය ලෙස දීර්ඝ ව කරුණු දැක්වීම සුදුසු වන්නේ නැත. එය වියදම් අධික ක්‍රියාවක් මෙන් ම කාලය ද නාස්ති වීමකි. ඉහතින් දැක්වූ සමිත පොඩි හාමුදුරුවෝ සහ උදිත පොඩි හාමුදුරුවෝ අතර සිදු වූ දූරකථන සංවාදය ද කෙටියෙන් සිදු වූවා නම් ඉතා සුදුසු ය. විශේෂයෙන් වර්තමානයේ ජංගම දූරකථන භාවිතයේ දී සමාජයේ අන් අයට ද හිරිහැරයක් වන සේ යොදා ගන්නා ආකාරය අප දක ඇත. දූරකථන භාවිතය ගැන සැලකිලිමත් වන්නකු තමන්ගේ අදහස් හරවත් ව, කෙටියෙන් අනෙකාට පැවසීම යෝග්‍ය වේ. සාරාංශකරණයේ මූලික ලක්‍ෂණ දැන ගැනීම වර්තමානයේ මෙවැනි සමාජ සම්බන්ධතා පැවැත්වීමේ දී ද බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මීට අමතර ව පුවත්පත් වාර්තා, හීරු ලිපි සම්පාදනයේ දී ද සාරාංශකරණ මූලධර්ම හඳුනා ගෙන භාවිත කිරීමට පෙළඹීම එදිනෙදා කටයුතු පහසු කරයි.

**සාරාංශකරණයේ දී දැන ගත යුතු මූලිකාංග රාශියකි.**

- දෙන ලද ඡේදයේ සෑම වචනයක් ම සැලකිල්ලට ගෙන කීප වරක් කියවා එහි මූලිකාර්ථය හොඳින් තේරුම් ගැනීම.
- දෙවන වර, තෙවන වර කියවීමේ දී ප්‍රධාන අරුත මතු වන ස්ථාන සලකුණු කර ගැනීම.
- අනවශ්‍ය කරුණු (උපමා, අලංකාර, විශේෂණ, පුනරුක්ති, නිපාත, උදහරණ) සලකුණු කර ගැනීම.
- ඡේදයේ මූලිකාර්ථය මතු වන සේ තමන්ගේ වචනවලින් සරල ව ලිවීම සහ මුල් ඡේදයේ අදහස් සමග ගැළපීම.
- සාරාංශය තමාගේ ම නිර්මාණයක් සේ තනි ඡේදයකින් ලිවීම සහ අක්‍ෂර වින්‍යාසය, පද බෙදීම, විරාම ලක්‍ෂණ, උක්තාඛ්‍යාත සම්බන්ධය ගැන සැලකිලිමත් වීම.
- සාරාංශයට අවශ්‍ය වචන ප්‍රමාණය දක්වා නොමැති නම් දෙන ලද ඡේදය 1/3ක් වන සේ ලිවීම.

### ක්‍රියාකාරකම 10.1

පහත සඳහන් පාඨයෙහි සාරාංශය 1/3ක් වන සේ ලියන්න.

සාහිත්‍යය කලාවකි. අදහස් හා හැඟීම් මිනිස් සිතට කාවදින සේ කීමේ විශිෂ්ට බලයක් සාහිත්‍යය කලාව සතු ය. ගද්‍ය සාහිත්‍යයටත් වඩා පද්‍ය සාහිත්‍යය මේ කාන්ත ගුණයෙන් උසස් තැනක් ගනී. පද්‍යය ගීතවත් ය. ශ්‍රවණ මාධූර්යයෙන් යුක්ත ය. පද්‍යයෙන් නගන මේ ගීත ස්වරය හෙවත් හඬ, මගින් කිසියම් හැඟීමක් අනිකකුගේ සිතට කාවදින ලෙස කීමට කවියා සමත් වේ. උත්තම ගණයේ කවීහු පද සංඝටනයෙන් නගින හඬ වහල් කර ගැනීමෙන් කවියේ අර්ථයෙන් ප්‍රකාශ කරන භාවයන් උද්දීපනය කරති.

### ක්‍රියාකාරකම 10.2

(i) ඔබ කැමති සති අන්ත පුවත්පතක කර්තෘ වාක්‍යයක් සාරාංශ කොට දක්වන්න.

(ii) පහත සඳහන් ඡේදය හොඳින් කියවා 1/3ක් වන සේ සාරාංශ කර ලියන්න.

ලොව දියුණු යැයි සලකන බොහෝ රටවල් සංවර්ධනය යැයි සලකන්නේ පරිසර සම්පත් හැකි තරම් ඉක්මනින් භාවිත කරමින් තාක්ෂණික වශයෙන් දියුණුවක් කරා යෑම ය. එම තාක්ෂණික දියුණුව බොහෝ විට මානව හිතවාදී බවෙන් තොර වූවකි. පරිසර හිතකාමී නොවූවකි. දියුණු යැයි කියා ගන්නා එම තාක්ෂණය භාවිත කරමින් සමස්ත සත්ත්ව ප්‍රජාවට ම හානිකර වූ පර්යේෂණ කරනු දක්නට ලැබේ. මෙලොව පරලොව සැපත සලසන සොඳුරු දහමකින් පෝෂණය නොලැබූ ඔවුන්ගේ මේ ගමනේ දූරදර්ශී බවක් නොමැත. එහි එක් ප්‍රතිඵලයක් ලෙස ඉදිරි වර්ෂ පනහක කාලය තුළ ගල් අඟුරු හා ගෑස් ද වසර සියයක කාලය තුළ ඛනිජ තෙල් ද මුළුමනින් ම අවසන් වීමට ඉඩ ඇත.

# 11 ප්‍රායෝගික ලේඛනය

මිනිසාට තනිව ම සිය ජීවන කටයුතු සපුරා ගැනීම දුෂ්කර ය. ඒ සඳහා සමාජයේ අන්‍ය සාමාජිකයන් සමග සම්බන්ධ වීමට සිදු වේ. මිනිසා වනාහි සමාජීය සත්ත්වයකු බැව් ඇරිස්ටෝටල් පඬිවරයා දක්වා ඇත්තේ එනිසා විය හැකි ය. එදිනෙදා ජීවන කටයුතු සාර්ථක කර ගැනීමට විවිධ ලේඛන ක්‍රම භාවිත කෙරේ.
ප්‍රායෝගික ලේඛන වශයෙන් හඳුන්වන්නේ එම ලේඛන විශේෂයන් ය. විවිධ අවශ්‍යතා සඳහා දැනුවත් කිරීම, සම්බන්ධතා ඇති කර ගැනීම, සුහදතා වර්ධනය, සාමූහික ක්‍රියාකාරකම්, සතුට ප්‍රකාශ කිරීම, විනෝදය ආදියට ප්‍රායෝගික ලේඛන උපයෝගී කරගනු ලබයි.

උඩුබද්දව ශ්‍රී ඥානෝදය පිරිවෙන් විහාරස්ථානයට එදින විශාල පිරිසක් ඒකරාශී ව සිටිය හ. පිරිවෙන් අධිපති ලොකු ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන් දායක පින්වතුන්ගේ සහභාගිත්වයෙන් රැස්වීම පැවැත්විණ. එහි මූලික අරමුණ වූයේ මෙවර වෙසක් දිනය නිමිත්තෙන්, විහාරස්ථානය කේන්ද්‍ර කර ගෙන විශේෂ උත්සවයක් සංවිධානය කිරීම යි. උත්සවය ප්‍රධාන අරමුණු තුනක් වෙනුවෙන් පවත්වන බව සාකච්ඡා විය. එනම්,

- වෙසක් පූජෝත්සවය පැවැත්වීම.
- නාහිමි ගුණානුස්මරණ පිංකම.
- පණ්ඩිත විභාගය සමත් පොඩි හාමුදුරුවන්ට සුබ පැතීම හා ප්‍රසාද පූජා වශයෙනි.

උත්සවයේ පූර්ව සංවිධාන කටයුතු කණ්ඩායම් කිහිපයක් විසින් බෙදා ගන්නා ලදි. ඒ අනුව වෙසක් සුබ පැතුම් පත් හා ශුභාශිර්වාද පත්‍රයක් සැකසීමේ වගකීම දහම් පාසලේ ප්‍රධානාචාර්ය හිමිපාණෝ ද, ඇදුරු මඩුල්ල හා ශිෂ්‍ය නායක නායිකාවෝ ද භාරගත්හ. ආරාධනා පත්‍රය සැකසීමේ වගකීම නාගහමුලගෙදර ඉස්කෝලේ හාමිනේ විසින් භාරගන්නා ලදි. දැන්වීම සකස් කිරීමේ වගකීම නා හිමියන්ට සහ ලොකු ඉස්කෝලේ මහත්මයාට පැවරිණ.
දින කිහිපයක ඇවෑමෙන් සියලු දෙනා ඔවුනොවුන්ගේ වගකීම් ඉටු කර ගෙන පැමිණ සිටියහ.

# සුබ පැතුම්

ගුණ නැණ සුවඳ
සැමටම බෙදූව
මනුවග සතට
සැනසුම සැදූව
සම්බුදු පියුම
මෙලොවට පිපුණ
වෙසගේ නුඹට
ආසිරි පැතුම

..................... විසින්

..................... වෙත

වෙසක්
සුබ
පැතුම් !

**ශුභාශිර්වාදයයි...........**

සසුනට කීර්තියක්
රටට - ගමට අභිමානයක්
ගුරු - දෙමාපියනට
සන්තුෂ්ටියක්......
ජීවිතයට නව එළියක්
ගෙන එමින්.......
අපේ සුගතඥාණ පොඩිහාමුදුරුවන්
වහන්සේ රාජකීය පණ්ඩිත උපාධිය
ලබා ගනිමින්
ශ්‍රී ලංකාවේ ම ප්‍රථම ස්ථානයට
පත්වීම නිමිත්තෙන් පිදෙන
- ශුභාශීර්වාද පූජාව යි -


ගුරු හිමියෝ,
සතර පේරුවේ දයක දයිකාවෝ,
උඩුබද්දව.

## සුබ පැතුම් පත්

සුබ පැතීම උතුම් මිනිස් ගුණයකි.
අනෙකාගේ සතුට වෙනුවෙන් මැදිහත්වීම
එයින් සිදු වේ. දුර්ගුණ මැකීමටත් - යහගුණ
වැඩීමටත් සුබ පැතුම යොද ගත හැකි ය.
ලිඛිත ව හෝ වාචික ව හෝ සුබ පැතුම්
සිදු කළ හැකි ය. එමඟින් සමඟිය සහජීවනය
ඇති වේ. වර්තමානයේ මුද්‍රිත මෙන් ම
විද්‍යුත් මාධ්‍ය ආශ්‍රයෙන් ද සුබ පැතුම් නිර්මාණය වේ.

සුබ පැතුමක ලක්ෂණ :-

- සරල බස් වහරක් යොද ගැනීම.
- ගද්‍ය හෝ පද්‍ය ශෛලීන් අනුගමනය කිරීම.
- සංක්ෂිප්ත ලෙස කරුණු ගොනු වී තිබීම.
- ආකර්ෂණීය බව.
- රසවත්භාවය.
- හැඩුම් සහ අපූරු නිමාවකින් යුක්ත වීම.



ක්‍රියාකාරකම 11.1

(i). තම හොඳ ම මිතුරාගේ උපන් දිනය වෙනුවෙන් සුබ පැතීමට පද්‍ය පාඨයක් සහිත නිර්මාණශීලී සුබ පැතුම් පතක් සාදන්න.

(ii). මූලික පිරිවෙන් අවසාන විභාගය උසස් ලෙස සමත් ශිෂ්‍යයාට සුබ පැතීමට යෝග්‍ය සුබ පැතුම් පතක් සකස් කරන්න.

(iii). සේවයෙන් විශ්‍රාම යන ගුරු ස්වාමීන් වහන්සේට සුබ පැතීමට ගීතයක් පබඳිමු ...................

# ආරාධනා පත්‍ර

**ආරාධනා පත්‍ර**

විවිධ පිංකම්, උත්සව, ප්‍රියසම්භාෂණ දේශන, සාහිත්‍ය උත්සවාදියට ප්‍රභූවරුන් විද්වතුන් හා ජනතාව ඒකරාශී කර ගැනීම සඳහා ලබා දෙන ලිඛිත පණිවුඩය ආරාධනා පත්‍රය යි. මෙය තැපැල් මගින් හෝ අදාළ පුද්ගලයා හමු වී හෝ ලබා දිය හැකි ය.

පැරණි සමාජයේ සිට මේ දක්වා වාචිකව මෙන් මං-බුලත් දීම මගින් ද ආරාධනා කර ඇත.

යම් කටයුත්තකට පිරිසක් සහභාගි කරවා ගැනීමෙන් වැඩි කලඑළියක් සහිත ව සිදු කිරීම යහපත් ය. එය සමාජයේ දැන හැඳිනීම් හිතවත්කම් වර්ධනය කර ගැනීම පිණිස හේතු වන සත්චාරිත්‍රයක් ලෙස ද දැක්විය හැකි ය.

හා ගහමුල ගෙදර ඉස්කෝලේ හාමිනේ ආරාධනා පත්‍ර කීපයක්ම සකසා ගෙනවිත් තිබුණි. ඒවායෙන් වඩාත් ගැළපෙන එකක් වැඩි දෙනාගේ අනුමැතියෙන් තෝරා ගන්නට යෙදුණි.

පහත සඳහන් වන්නේ එම  ආරාධනා පත්‍රය යි.

## කාරුණික  ඇරයුම යි.

උඩුබද්දව " ශ්‍රී ඥානෝදය " පිරිවෙන් විහාරස්ථානයේ මෙවර වෙසක්  උත්සවය නිමිත්තෙන්,

- වෙසක් පූජෝත්සව සංස්කෘතික වැඩසටහන.
- නාහිමි ගුණානුස්මරණ පිංකම.
- ශුභාශිර්වාද පැතීමේ හා ප්‍රසාද පූජෝත්සවය.

**2011 වෙසක් මස 13 දින ප.ව. 2.30 සිට**

ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී ගරු නාරම්පනාවේ රාහුල නා හිමියන්ගේ මූලිකත්වයෙන් ගිහි, පැවිදි  ප්‍රභූන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ.

..........................................................................................................

සසුන් ලැදි ඔබ වහන්සේගේ / ඔබ තුමාගේ / ඔබ තුමියගේ  සහභාගීත්වය කාරුණික ව අපේක්ෂා කරමු.

2011.05.01
උඩුබද්දව.                                        විහාරාධිපති හිමි සහ දයක සභාව.

ආරාධනා පත්‍රයක ඇතුළත් විය යුතු කරුණු :

- මාතෘකා පාඨය හා ආශිර්වාද ආරාධනා පාඨය.
- ආරාධනයේ අරමුණ.
- අදාළ ස්ථානය පිළිබඳ.
- විශේෂ සහභාගිත්වයන් ගැන.
- පැවැත්වෙන දිනය හා වේලාව.
- ආරාධනය කරන්නේ කවුද?
- ආරාධනාකරු / ස්ථානය / දිනය.

ආරාධනා පත්‍ර සැකසීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

- සංක්ෂිප්ත බව.
- නිවැරදි සරල බස.
- අනවශ්‍ය විස්තරවලින් බැහැරවීම.
- සිත්ගන්නා නිමාව (හුරු බුහුටි බව).
- නිර්මාණශීලී බව.
- පෙළඹවීමේ ගුණය.

ආරාධනා කරන අවස්ථා කිහිපයක් :

- පිංකම් (පැවිදි, උපසම්පද, කඨින පූජා, ගුණානුස්මරණ).
- විවෘත කිරීම් (විහාර, පුස්තකාල, ධර්මශාලා , සංඝාවාස, ප්‍රජාශාලා).
- මුල්ගල් තැබීම්.
- සාහිත්‍ය උත්සව.
- විවාහ මංගල උත්සව.
- ත්‍යාග ප්‍රදාන, තනතුරු හා සන්නස් පත්‍ර ප්‍රදාන උත්සව.

**ක්‍රියාකාරකම 11.2**

(i). පිරිවෙනේ පැවැත්වෙන වාර්ෂික සාහිත්‍ය උත්සවය සඳහා ප්‍රභූන් සහ සාහිත්‍යකරුවන්ට ආරාධනා කිරීමට ආරාධනා පත්‍රයක් සැලසුම් කරන්න.

(ii). පැරණි සමාජයේ පැවති ආරාධනා ක්‍රම කීපයක් විස්තර කර පොත් පිංචක් සකසන්න.

නාහිමියන් සහ ලොකු ඉස්කෝලේ මහත්තයා දැන්වීමට අවශ්‍ය මූලික කරුණු එකතු කර ගෙන විත් තිබිණි. එම කරුණු ගොනුව අනුව ඒ වෙලාවේ ම දැන්වීමක් සැලසුම් කෙරිණි. එම දැන්වීමේ ආකෘතියක් පහත දැක්වේ.

# දැන්වීමයි !

ගුණානුස්මරණ පිංකමක්

හා

ආශීර්වාද පැතීමේ උත්සවයක්.

කාරුණික සුපින්වතුනි,

**2011.05.13 ප.ව 2.30 සිට**

**උඩුබද්දව ශ්‍රී ඥානෝදය පිරිවෙන් විහාරස්ථානයේ දී ........**

වෙසක් පූජෝත්සවයට සමගාමී ව,

* අපවත් වී වදාළ නාහිමි ගුණානුස්මරණය කිරීම.
* උසස් ලෙස උපාධිය සමත් නාවලපිටියේ සුගතඥාණ හිමියන්ට ශුභාශීර්වාද ප්‍රාර්ථනා කිරීම.
* සංස්කෘතික වැඩසටහන.

මුලසුන : ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ

ප්‍රදේශයේ ගිහි - පැවිදි ප්‍රභූවරුන්ගේ හා දයක පින්වතුන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වේ.

උත්සව සභාවෙන් අනතුරු ව ගුණානුස්මරණ ධර්මදේශනය පැවැත්වේ.

සියල්ලන්ගේ පැමිණීම ගෞරවයෙන් අපේක්ෂා කරමු.

දැන්වීම් අවශ්‍ය වන අවස්ථා;

* යම් වැඩසටහනක් පිළිබඳ ප්‍රජාව දැනුම්වත් කිරීමට..... උදා: පිංකම්, ආගමික උත්සව, විවෘත කිරීම්, මුල්ගල් තැබීම්.
* යමක් පිළිබඳ දැනුම ලබා දී සහභාගීත්වයක් පෙළඹවීමක් ඇති කිරීමට, උදා: අධ්‍යාපනික, දේශපාලනික, සංස්කෘතික අවශ්‍යතා සඳහා.
* යම් භාණ්ඩයක් හෝ සේවාවක් පිළිබඳ ප්‍රසිද්ධියක් පාරිභෝගිකයාට ලබාදීමත්, විකුණුම් ලබා ගැනීමටත් .........
* කලාව, සෞන්දර්යය වින්දන වැඩ සටහන් ගැන දැනුම්වත් කිරීම ආදිය සඳහා.

යොදා ගනු ලබන ලිඛිත සන්නිවේදන ක්‍රමය දැන්වීමකි. පැරණි සමාජයේ හූවකින්, අණබෙරයකින්, සෙල්ලිපියකින් සිදු කළ දැන්වීම වර්තමානයේ ලිඛිත, මුද්‍රිත ක්‍රමයට මෙන් ම විද්‍යුත් තාක්ෂණික ක්‍රමය උපයෝගී කොටගෙන සිදු කරනු ලබන්නක් වී ඇත.

දැන්වීමක් සැකසීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු;

* මුඛ්‍ය තේමාව කැපී පෙනෙන ලෙස පැහැදිලි ව දැක්වීම.
* ස්ථානය - දිනය - වේලාව නිවැරදි ව දැක්වීම.
* පුද්ගලනාම - තනතුරු ආදිය නිවැරදි ව දැක්වීම.
* චිත්‍ර ,ඡායාරූප, වර්ණ, හැඩතල ගැළපෙන පරිදි යොදා ගැනීම.
* පළකරන්නා සහ ස්ථානය දැක්වීම.
* සරල භාෂාවක් යොදා ගැනීම.
* සදාචාරාත්මක හා නෛතික සීමාවන් ගැන අවධානය.
* අලංකාරාත්මක - නිර්මාණශීලී ආකර්ෂණයන් සහිත ව ගොඩනැගීම.

ක්‍රියාකාරකම් 01.

ඔබ පිරිවෙනේ ආදිකර්තෘ දිනය වෙනුවෙන් පැවැත්වෙන උත්සවය පිළිබඳ දැනුම් දීමට දැන්වීමක් සකසන්න.

ක්‍රියාකාරකම් 02.

පැරණි සමාජවල දැනුම් දීම සඳහා භාවිත කළ ක්‍රම ගැන වගුවක් පිළියෙල කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

ක්‍රියාකාරකම් 03.

ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් කිහිපයක කරුණු කෙරෙහි අවධානය යොමුකරන්න. එම දැන්වීම්වල ඇති ( පුවත්පත් , ගුවන් විදුලි, රූපවාහිනී ) යහපත් හා අයහපත් බලපෑම් මොනවාදැයි අභ්‍යාස පොතේ සඳහන් කරන්න.

# 12 අර්ථාවබෝධය

භාෂාව නොනැවතී ගලන ගංගාවක් වැනි ය. හැමවිට ම නවාංග එකතු වෙමින් ඉදිරියට ගලා යයි. පැරණි බසේ වචන අලුත් වේ. එවිට ඇතැම් පද උච්චාරණ විලාසයෙන් ද අර්ථයෙන් ද වෙනස් වේ. ඇතැම් විට වෙනත් භාෂාවන් ඇසුර නිසා ද බස වෙනස් විය හැකි ය. ගද්‍ය පද්‍ය සාහිත්‍ය නිර්මාණයේ දී නව පැරණි මෙන් ම සංස්කෘත, පාලි භාෂාවල වචන භාවිත කෙරේ. එම ප්‍රකාශනවල අදහස් තේරුම් ගැනීමට පදවල අර්ථ අවබෝධ කර ගත යුතු වේ. එසේ භාෂාත්මක ප්‍රකාශනවල ඇතුළත් අදහස් තේරුම් ගැනීම අර්ථාවබෝධය යි. අර්ථාවබෝධය උසස් ලෙස භාෂාව හැසිරවීමට අවශ්‍ය කුසලතාවකි.

අලුත මහණ වූ සමිත පොඩිහාමුදුරුවන්ට අවුරුදු දහය සම්පූර්ණ වුණා විතරයි. උන්වහන්සේ පැවිදි ජීවිතයේ දී මුහුණ දුන් අත්දැකීම් කිහිපයකි.

- පේරුදෙන් ගෙනාපු උපාසක උපාසිකාවන්ට ලොකු හාමුදුරුවෝ පින් අනුමෝදන් කළා.
  "ත්‍රෛලෝකතල තිලක සකලඥෙය සාගර පාරගතාශේෂ ගුණරත්න මන්දිරායමාන, අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ උදෙසා ශ්‍රද්ධ වූ.........."
- ගලේ පන්සලේ නායක හාමුදුරුවෝ පිරිත් අනුශාසනාවක් කරනවා.
  " ශ්‍රද්ධා බුද්ධි සම්පන්න කෘතවේදී, ගුණගරුක පින්වතුනි, ලොව්තුරා තථාගත බුදුපියාණන් වහන්සේ ජීවමාන ව වැඩ සිටි කාලයේ විවිධ අවස්ථාවල තමන් වහන්සේ හමුවට පැමිණියා වූ........."
- තෙපාතිස් උපාසක ආතා පුත් පෝය දවසේ ධර්මශාලාවේ දී ජාතක පොත කියවනවා.
  "යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන කල්හි, අප මහ බෝසතාණෝ විෂ වෛද්‍ය කුලයක ඉපිද, වෙදකමින් ජීවත් වන්නාහු ය. එකල එක් ජනපද වාසී වූ මනුෂ්‍යයකු සර්පයෙක් දෂ්ට කොටපුයේ ය....."
- පත්තිනි දේවාලයේ කපු මහතා දේවාලයේ සේවාව කරමින් කවි කියවනවා.

  "උතුම් බුදු රුවනේ
  ලොව්තුරු දහම් සරණේ
  සමග සඟ රුවනේ
  බැතින් නමදිමු මෙතුන් සරණේ"

පොඩි හාමුදුරුවන්ට මේ එක අවස්ථාවකවත් මොනවා කියනවද කියලා හරියට තේරුණේ නෑ.

- මේ බව වටහා ගත්තු ලොකු හාමුදුරුවෝ පොඩි හාමුදුරුවන්ට අවවාද කළා. " පොඩිනම හාමුදුරු කෙනෙක් වුණහම හොඳට පාලි, සංස්කෘත භාෂා ඉගෙන ගන්ඩ ඕනෑ. එතකොට තමයි සිංහල භාෂාව වුණත් හොඳට තේරුම් ගන්ඩ පුළුවන් වෙන්නෙ. පැරණි බණ කථා පොත්, කවිපොත් තේරුම් ගන්න එතකොට හොඳට පුළුවන් වෙනවා........"

**අර්ථාවබෝධයට උපදෙස්;**

- පෙළ හොඳින් කියවන්න.
- දුෂ්කර වචන ලකුණු කර ගන්න.
- ඒවායෙහි අර්ථ දැන ගන්න.
- එම අර්ථ යොදා පෙළ නැවත කියවන්න.
- එය ඔබේ බසින් ලියන්න.
- එය අර්ථවත් ව ගැළපේදැයි සංසන්දනය කර බලන්න.
- ගුරුවරයාගේ උපදෙස් අනුව ශබ්දකෝෂය භාවිතයට හුරුවන්න.

## - තාරකා -

දිලිහි දිලිහි
ආකාසේ
බබලන මල් -
තාරකා

බැබලි බැබලි
ආකාසේ
දිලිහෙන මල් -
තාරකා



කළුවර රෑ
ආකාසේ
සිනාහ වෙවී -
තාරකා

ගන්ටත් බෑ
දෙන්ටත් බෑ
පුංචි රුවන් -
තාරකා

- ආනන්ද රාජකරුණා -

ක්‍රියාකාරකම 12.1

i. මෙම පැදිපෙළ, පන්තියේ සියලු දෙනා එක් ව ශබ්ද නගා කියවන්න.

ii. මෙහි කවියා තරු ගැන විශේෂිත ලෙස දක්වා ඇති අයුරු උපුටා ලියන්න.

iii. පැදි පෙළෙහි අර්ථය ඔබේ බසින් ලියන්න.

පහත සඳහන් ඡේදය කියවා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

## මිණි ප්‍රශ්නය

ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් කුස රජ්ජුරුවන්ට දුන් මැණික තෙමේ අට තැනෙකින් වක් වූයේ ය. ඒ අටවක් මැණිකෙහි ශක්‍රයන් ඇවූණු පුරාතන හුය දිරා ගොස් කැඩී ගියේ ය. පරණ හුය හැරපියා අලුත් හුයක් අවුණා ලන්නට කිසි කෙනෙක් නොපොහොසත් ය. එක් දවසක් මේ මැණිකෙහි "පරණ දිරා ගිය හුය හැරපියා අලුත් ලණුවක් ලව" යි කියා යවමැදුම්ගමැ ඇත්තනට වේදේහ රජ්ජුරුවෝ යැවූහ.

ගම් වැස්සෝ පරණ හුය අරින්නටත් අලුත් හුය ලන්නටත් නො පිළිවන් වූවා හු මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට කීවාහු ය. පණ්ඩිතයන් වහන්සේ " තෙපි නොසිතව, මී ටිකක් ගෙන්වා ගනුව" යි කියා ගෙන්වාගෙන මැණිකෙහි දෙකෙළවර සිදුරෙහි මී බිඳු ගල්වා, පලස් හුයින් ලණුවක් අඹරා අග මීයෙහි ගලා මඳක් මැණිකේ සිදුරට වද්දලා, කුහුඹුවන් නික්මෙන කුහුඹු බිලයෙක තබා වූ සේක.

කුහුඹුවෝ මීයෙහි ගඳින් බිලයෙන් නික්ම මැණිකෙහි දිරා ගිය පරණ හුය කාගෙන පලස් හු අග ඩැහැගෙන යටින් අදනාහු අනෙක් ඇලයෙන් පිටත් කොට පීහ. පණ්ඩිතයන් වහන්සේ මැණිකෙහි ලණුව ඇවිණී ගිය බව දැන ගෙන "රජ්ජුරුවන්ට දෙව" යි කියා ගම්වැස්සන්ට මැණික දුන් සේක. ගම්වැස්සෝ රජ්ජුරුවන්ට යැවූහ. රජ්ජුරුවෝ ලණුව ඇවුණු උපාය අසා සතුටු වූහ.

(උම්මග්ග ජාතකය)

අර්ථ පුහුණුවට

| | |
|---|---|
| හූ ලණුවකින් | = නූලකින්. |
| පලස් හුයින් | = පලස් වියීමට ගන්නා නූලෙන්. |
| බිලයෙක | = සිදුරක. |
| ගදින් | = සුවඳින්. |
| ඇලයෙන් | = පැත්තෙන්. |

ක්‍රියාකාරකම 12.2

i. ඉහත සඳහන් කථා පුවත ඔබේ බසින් ලියන්න.
ii. මෙහි එන දුෂ්කර වචන සොයා ඒවායෙහි අදහස් ලියන්න.
iii. පහත දක්වන යෙදුම්වල අර්ථ ලියන්න.
    (අ). පරණ හුය හැරපියා අලුත් හුයක් අවුණා ලන්නට කිසි කෙනෙක් නොපොහොසත් ය.
    (ආ) මැණිකෙහි දෙකෙළවර සිදුරෙහි මී බිඳු ගල්වා .

# 13 විරාම ලක්ෂණ

විරාමය යනු නැවතීම යි. ලේඛනයෙහි මෙන් ම කථනයෙහි විරාම යොදමින් අදහස් ඉදිරිපත් කිරීම මගින් නිරවුල් ව සහ පැහැදිලි ව තේරුම් ගැනීම පහසු කරයි. කථනයේ දී අංගචලනය, හඬ උස් පහත් කිරීම වැනි උපක්‍රම භාවිත කිරීමෙන් ස්වකීය අදහස් පහසුවෙන් අන් අයට වටහා දිය හැකි ය. කථනයේ දී භාවිත වන විරාමය දැක්වීම සඳහා ලේඛනයේ දී යොදා ගන්නේ විශේෂ සලකුණු කිහිපයකි. මේවා විරාම ලක්‍ෂණ ලෙස හැඳින්වේ.

කථනයේ දී තම අදහස් නිරවුල් ව, ප්‍රාණවත් ව ඉදිරිපත් කිරීමට යම් උපක්‍රම භාවිත කළ නමුත් ලේඛනයේ දී එවැනි සමහර උපක්‍රම භාවිත කළ නොහැකි ය. ලේඛකයා තමන්ගේ අදහස් නිරවුල් ව ප්‍රකාශ කිරීමේ දී යොදා ගන්නේ විශේෂ සලකුණු කිහිපයකි. විරාම ලකුණු ලෙස හඳුන්වන ඒවා යොදා ගැනීමෙන් ලේඛනය පැහැදිලි වන අතර එහි ඇතුළත් කරුණු පාඨකයාට අවබෝධ කර ගැනීමට ද පහසු ය.

උදාහරණයක් ;

- බසය පෙරළුණා.
- බසය පෙරළුණා?
- බසය පෙරළුණා!

ඉහත ප්‍රකාශ පුද්ගලයකු කථා ව්‍යවහාරයේ දී භාවිත කරන විට එහි උච්චාරණ ස්වරූපය අනුව අදහස තේරුම් යන නමුත් ලේඛනයේ දී ඒ සඳහා යොදා ඇති විරාම ලකුණු අනුව අදහස තේරුම් ගැනීම පහසු වේ.

**පහත සඳහන් වන්නේ රාහුල පොඩි හාමුදුරුවෝ ඇසළ පුන්පොහොය දින පෙහෙවස් සමාදන් වූ උවසු උවැසියන් සඳහා දේශනා කළ ධර්ම දේශනයෙන් කොටසකි.**

බණ අසන්නට සූදානම් වී සිටින සැදැහැවත් පින්වතුනි, අද මම මේ පින්වතුන්ට කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ සීලවනාග ජාතකය යි. අපේ බෝසතාණන් වහන්සේ එක්තරා ආත්ම භාවයක ඇතෙක් වෙලා උපන්නා; හරිම සිල්වත්, ඒ නිසාම සීලවනාග කියලා නමකුත් වැටුණා. එක් දවසක් මේ ඇතා සිටිය වනයට එනවා දර දඬු සොයාගෙන මනුස්සයෙක්. ඔහු කැලේ දර දඬු සොයමින් යද්දී අතරමං වුණා. පාර හොයාගන්න බැරිව ඇවිදින කොට ඔහුට සීලවනාග ඇතා හමු වුණා. ඇතා ඔහුගෙන් කරුණු විමසුවා. ඇතාට ඔහු ගැන අනුකම්පා හිතිලා පිටේ තියාගෙන කැලයෙන් එළියට ගෙනාවා.



එළියට ගෙනවිත් පාර පෙන්නලා ගියා. අර මනුස්සයා ඇතා තමන්ට කළ උදව්ව ගැන නොසලකා පිටේ සිටිද්දී ම ඒ කැලේ සලකුණු මතක තියා ගත්තා. ඇයි දන්නව ද? පින්වත්නි, ඒ ඇතාට තිබුණා, දිගම දිග ඇත් දළ දෙකක්. පස්සේ ඇවිත් ඒ දළ දෙක කපාගෙන යන්න කියලා හිතාගෙන යි, ඔහු මග සලකුණු මතක තියා ගත්තේ.

ඉතින් මේ දුෂ්ට මිනිසා කැළයෙන් එළියට ඇවිත් දිගට ම ගියේ ඇත් දළ වැඩ කරන වීදියට. ජීවත් ව සිටින ඇතෙකුගේ දළ දෙකක් තිබෙනවා. එය ගෙනත් දෙන්න කීයක් දෙනවද කියලා ඒ වීදියේ මුදලාලි කෙනෙකුගෙන් ඔහු ඇහුවා. ජීව දන්ත නිසා වැඩි මිලක් දෙන බව මුදලාලි කීවා. නපුරු මිනිහා ඒක අහලා කියතකුත් අරගෙන කැළේට ගිහින් සීලවනාග ඇතා හමු වෙලා මෙහෙම කියනවා..................

"අනේ ! ඇත් රජුනි, මම හරිම දුප්පත්,
මට විකුණලා ජීවත් වෙන්න ඔය
දළ දෙක දෙනවද?" කියලා.

ඇතා කිසිම කතාවක් නැතිව බිම දිගාවී දළ දෙක කපාගෙන යන්න ඉඩ දුන්නා. කියතේ එක පැත්තකින් අර මිනිහා අල්ලාගෙන සිටිද්දී ඇතා තම හොඬෙන් අනිත් පැත්ත අල්ලාගෙන දළ කපන්න පවා උදව් කළා. මිනිහා ඒ දළ දෙක අරගෙන ගිහින් විකුණලා හොඳට කාලා බීලා ජීවත් වුණා. මේ මිනිසාගේ දුෂ්ටකම නිසාම ආයෙත් දවසක ඇතාගේ ඉතිරි දළ කොට දෙක කපාගන්නට කල්පනා කළා. එහෙම හිතලා මිනිහා සීලවනාග ඇතා ළඟට ඇවිත් මහා බොරුවක් කීවා.

"අනේ ඇත් රජුනි, එදා අරගෙන ගිය
දළ දෙක විකුණලා ණය ගෙව්වා විතරයි.
දැන් ජීවත් වෙන්න විදිහක් නෑ.
ඔබතුමාගේ ඉතිරි දළ කොට දෙක
දෙනව ද?".... කියලා ඇහුවා.

ඇත්තටම පිංවතුනි, කපන්න කියලා දළ දෙකක් නැහැ. ඒත් ඇතා මේ මිනිහා ගැන කරුණාවෙන් බිම නිදාගත්තා, කපන්න කියලා. මේ නපුරු මිනිහා ඇතාගේ හිස මත නැගලා විළුඹෙන් ඇනලා, ඇනලා ලේ පනිද්දී අර දළ කෑලි දෙක කපා ගත්තා. ඇතාට හරිම වේදනාව යි. ඒත් ඉවසුවා. ඇතා මේ වේදනාවෙන් කෙඳිරි ගාද්දී හිසෙන් බැහැලා මිනිහා අර දළ කොට දෙකත් අරගෙන යන්න ගියා. හැබැයි පිංවතුනි, ඒ මිනිහාට වැඩි දුරක් යන්න ලැබුනේ නෑ. මිනිහාගේ තිබුණු නපුරුකම නිසාම පොළොව පළාගෙන නිරයට වැටුණා. ඒ බෝසත් ඇතා වේදනාව ඉවසගන්න බැරුව මියැදුණා. ඉතින්

පිංවතුනි, ඒ නපුරු මිනිසා වෙන කවුරුත් නෙවේ, අපේ බුදුන්වහන්සේගේ කාලයේ දේවදත්ත වෙලා ඉපදුණේ එයා තමයි. මේ ජාතක කතාවෙන් අප කාටත් කියලා දෙන්නේ කළගුණ නොසලකන නපුරු ගති ඇති අය දුගතිවල ඉපදෙන බව යි.

ධර්ම දේශනාව අවසානයේ ඊට සවන් දුන් උපාසිකාවන් දෙදෙනෙකු රාහුල පොඩිහාමුදුරුවන්ගේ හැකියාවන් ගැන කතා බහක යෙදුණේ මෙසේ ය.

බිසෝහාමි :- "රාහුල පොඩි හාමුදුරුවන්ගේ බණකතාව නම් හරිම අපූරුයි".

යසෝහාමි :- "උන්වහන්සේ බණකතාව කියපු විදිහ නම් දුකේ බෑ..... අහගෙන ඉන්න ආසයි.

බිසෝහාමි :- "මං බලාගෙන, සමහර අයගේ ඇස්වලට කඳුළු ආවා. මගේ ඇස්වලටත් කඳුළු ආවා".

යසෝහාමි :- අර ඇත්දළ කොට දෙක කපපු එක ගැන කියනකොට නම් කාට ද ඇඬෙන්නේ නැත්තේ"?

බිසෝහාමි :- "ඇත්තට ම බණකතාව පැහැදිලි කරපු හැටි. අම්මපා පොඩි ළමයකුටත් තේරෙනවා. උන්වහන්සේගේ කටහඬත් කෙනෙකුට අහගෙන ඉන්න හරිම අපූරුයි"

යසෝහාමි :- එන මාසේ අපේ අම්මගේ අවුරුද්දේ පිංකමටත් බණට උන්වහන්සේට ආරාධනා කරන්ට ඕන".

බිසෝහාමි :- කවද හරි අපේ පිරිවෙනේ රාහුල පොඩිහාමුදුරුවෝ හොඳ ප්‍රසිද්ධ පණ්ඩිත හාමුදුරුනමක් වෙයි කියලා මට හිතෙනවා යසෝ.

බිසෝහාමිටත්, යසෝහාමිටත් රාහුල පොඩි හාමුදුරුවන්ගේ බණකතාව පිළිබඳ ව මෙතරම් පැහැදීමක් ඇති වූයේ කුමක් නිසා ද? සීලවනාග ජාතක කතාවේ කථා පුවතට අමතර ව උන්වහන්සේගේ කථා විලාසය, හඬ උස් පහත් කිරීම, වාක්‍ය අතරතුර විරාම තබමින් අර්ථය ඉස්මතු වන සේ වචන හැසිරවීම, අංගචලනය වැනි උපක්‍රම භාවිත කිරීමට රාහුල හිමියන් සතු වූ හැකියාව යනාදිය බව පැහැදිලි ය. කථාව කෙතරම් සිත්ගන්නාසුලු වුවත්, ඊට ජීව ගුණයක් එකතු වන්නේ ඉදිරිපත් කිරීමේ දී ඒ සඳහා සුදුසු උපක්‍රම භාවිත කරන්නේ නම් පමණි.

### විරාම ලකුණු හඳුනාගනිමු

| | |
|---|---|
| නැවතීමේ ලකුණ | = . |
| කොමාව | = , |
| තිත් කොමාව | = ; |
| වරහන් | = ( ) |
| උද්ධෘතය | = “ ” |

අප හඳුනා ගත් විරාම ලක්ෂණ පහ වන කොමාව, තිත් කොමාව, වරහන්, උද්ධෘතය, නැවතීමේ ලකුණ පහත සඳහන් වාක්‍යවල යොදා ඇති ආකාරය බලන්න.

- අනුරාධපුරය, දඹදෙණිය, නාගසේන, අනුලා, ආදී පද සංඥා නාම පද ලෙස හඳුන්වයි.
- ඒ කවිය මිහිරි ය; අර්ථවත් ය; ගීතවත් ය; සිත් ගන්නාසුලු ය.
- පළමු වන විජයබාහු රජතුමා ජම්බුකෝල පට්ටන (දඹකොළ පටුන) විහාරය ප්‍රතිසංස්කරණය කළ බව වංශකථාවල සඳහන් වේ.
- අම්මා වෙත ලියූ ලිපියේ "මම හෙට ගෙදර එමි" යි සිරිපාල සඳහන් කර තිබුණි.

## විරාම ලකුණු යොදන ආකාරය හඳුනා ගනිමු.

### තිත (.)

- නැවතීමේ ලකුණ හෙවත් සමාප්ති ලකුණ.
- වාක්‍යයක අවසානය දැක්වීම සඳහා යෙදේ.
- නාමයක් කෙටිකර දැක්වීමේ දී යෙදේ.

  උදා :- ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (ලං.දු.දෙ.)
  පෙරවරු (පෙ.ව.)
- අවුරුදු මාස ආදිය දැක්වීමේ දී යෙදේ.

  උදා :- 1995.05.17

### කොමාව ( , )

- මඳ විරාමයක් දැක්වීමේ දී වාක්‍යයක කොටසක් අතර යොදන සලකුණකි.

  උදා :- මොළය, රුධිරය, ආමාශය ආදී ශරීර අවයව ගැන සලකා බලන කල, මිනිසා හා චිම්පන්සියා අතර වෙනස්කම් ඇත.
- එකිනෙක හා සම්බන්ධ වන කරුණු දැක්වීමේ දී ද කොමාව යෙදේ.

  උදා :- රජතුමාගේ උයන රතු, කහ, සුදු වර්ණ සහිත මල්වලින් පිරී තිබුණි.

  උදා :- ඈ මහත් ශෝකයෙන් සිටින බව සුදුමැලි වූ ඇගේ මුහුණේ පෙනුමෙන් ද, ඈ නිශ්ශබ්ද ව සිටීමෙන් ද, මට වැටහිණ.
- ආමන්ත්‍රණ පදයක් සමග අන්‍ය පද වෙන් කිරීමේ දී කොමාව යෙදේ.

  උදා :- මගිය, මා කියන්නක් කරව.

## තිත් කොමාව ( ; )

- කොමාවට වඩා දීර්ඝ විරාමයක් පෙන්වීමට අවශ්‍ය ස්ථානවල දී යෙදේ.

  උදා:- නළඟන රැඟුමෙන් රජු සතුටින් පිනා ගියේ ය; මහ හඬින් සිනාසුණේ ය; නාටිකාංගනාවන්ට තෑගි බෝග දුන්නේ ය.

- ඉදිරි ප්‍රකාශන හා පවතින සම්බන්ධය දැක්වීමේ දී යෙදේ.

  උදා:- පොඩි හාමුදුරුවන්ගේ ධර්ම දේශනාව මිහිරි ය; අගනේ ය.

## වරහන් ( )

- වෙන් කර දැක්වීමේ දී, අදහසක් වඩා පැහැදිලි කිරීමක දී, මෙම විරාමය යොදා ගනී. උදා:- වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් කියවෙන (උක්ත පද) පදය ප්‍රථමා විභක්ති ගනියි.

  සයවන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව 1415 1467) කෝට්ටේ යුගයේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකි.

## උද්ධෘත පාඨ ලක්ෂණය ( " " )

- පෙරළි කොමා ලෙස ද හඳුන්වන මෙම සලකුණ මුඛ පාඨ, උද්ධෘත පාඨ, විශේෂ ව්‍යවහාර යොදන අවස්ථාවල දී භාවිත කරන විරාම ලකුණකි.

  උදා :- "දරුවන් මෙහට ගෙදර එති'යි මව්පියෝ බලා සිටිති''.

  "වෛරයෙන් වෛරය නොසංසිඳේ" යනු බුද්ධ වචනයකි.

  ශ්‍රී ලංකාව " ඉන්දියන් සාගරයේ මුතු ඇටයකි " යන්න බොහෝ දෙනාගේ අදහසකි.

### ක්‍රියාකාරකම 13.1

i. පහත සඳහන් වාක්‍ය ඔබ උගත් විරාම ලකුණු යොදමින් නැවත ලියන්න.

අ) නංගිගේ ගවුම සුදු නිල් රතු වර්ණවලින් යුත් අලංකාර මල්වලින් පිරී තිබුණි

ආ) යසෝහාමි උපාසක මාතාව සිල්වත් ය ගුණවත් ය නැණවත් ය

ඇ) දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය කාලය තුළ බුදුදහම මෙරටට ගෙන ආ බව මහාවංශයේ සඳහන් ය

ඈ) අහසින් වැටෙන එක දිය බිඳක් හෝ ප්‍රයෝජනයට නොගෙන අපතේ නොහරිම් මහපැරකුම්බා රජුගේ උදාර ප්‍රකාශයකි

ඉ) පිංවතුනි බණ ඇසීමට පෙරාතුව පන්සිල් සමාදන් වීමට නමස්කාරය කියන්න

ක්‍රියාකාරකම 13.2

පහත දක්වා ඇති විරාම ලකුණු යොදා අර්ථවත් වාක්‍ය සාදන්න.

i) .

ii) ,

iii) ;

iv) ( )

v) " "

ක්‍රියාකාරකම 13.3

පහත සඳහන් එක් එක් වාක්‍යයේ යොදා ඇති විරාම ලක්ෂණ නම් කර එම සංකේතයෙන් අර්ථවත් වන දෑ පැහැදිලි කරන්න.

i) මාර්ටින් වික්‍රමසිංහ "දක්ෂ ලේඛකයෙකි" යන්න බොහෝ දෙනා ගේ අදහස කි.

ii) මඩොල්දූව, ගම්පෙරළිය, කලියුගය, විරාගය, යුගාන්තය ආදිය මාර්ටින් වික්‍රමසිංහ මහතා ලියූ නවකතා ය.

iii) අග්නි පූජාව (ගිනි පිදීම) භාරත සමාජයේ පැවති පූජා විධියකි.


iv) ගුරුතුමා පන්තියට පැමිණියේ ය; පාඩමට සූදානම් විය; සිසුන්ගේ දැනුම පරීක්ෂා කළේ ය; රසවත් පාඩමක් ඉගැන්වූයේ ය.

# 14 කාරක

**කාරක** නම් කරන්නා යනු යි. ක්‍රියාවක කරන්නා කවුරු ද යන්න මෙයින් කියැවේ. නැති නම් උක්තය කවුද යන්න යි. කරන්නා කර්තෘ වූ විට එය **කර්තෘ කාරක ය**. කරන්නා හෙවත් උක්තය කර්මය වූ විට එය **කර්ම කාරකයයි**. ක්‍රියා මාත්‍රයක් හැඟවෙන ලෙස යමක් කෙරේ නම් ඒ **භාව කාරකයයි.**

මතකයට

| | | |
|---|---|---|
| කර්තෘ කාරක | = | කතු කිරිය |
| කර්ම කාරක | = | කම් කිරිය |
| භාව කාරක | = | භව් කිරිය |




කාරක අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයේ ආඛ්‍යාත ප්‍රත්‍යය සමග යෙදේ. එහි දී කර්තෘ කාරක හා කර්ම කාරක සඳහා ප්‍රථම, මධ්‍යම සහ උත්තම යන පුරුෂත්‍රය ද ඒක වචන හා බහු වචන භේදය ද බලපායි. එනමුත් භාවකාරකය සඳහා පුරුෂ හා වචන භේදය නැත. එහි ඇත්තේ ප්‍රථම පුරුෂ ඒක වචන ප්‍රත්‍යය පමණි.

අතීත කාල ආඛ්‍යාත ප්‍රත්‍ය - කර්තෘ කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | ඊ | බැලී | බල | ඌ | බැලූ |
| මධ්‍යම පුරුෂ | බල | ඊහි | බැලීහි | බල | ඌහු | බැලූහු |
| උත්තම පුරුෂ | බල | ඊමි | බැලීමි | බල | ඌමු | බැලූමු |

අතීත කාල ආඛ්‍යාත ප්‍රත්‍ය - කර්ම කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | ඉණි | බැලිණි | බල | උණු | බැලුණු |
| මධ්‍යම පුරුෂ | බල | ඉණිහි | බැලිණිහි | බල | උණුහු | බැලුණුහු |
| උත්තම පුරුෂ | බල | ඉණිමි | බැලිණිමි | බල | උණුමු | බැලුණුමු |

වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍ය - කර්තෘ කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | යි | බලයි | බල | ති | බලති |
| මධ්‍යම පුරුෂ | බල | හි | බලහි | බල | හු | බලහු |
| උත්තම පුරුෂ | බල | මි | බලමි | බල | මු | බලමු |

වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍ය - කර්ම කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | එයි | බැලෙයි | බල | එති | බැලෙති |
| මධ්‍යම පුරුෂ | බල | එහි | බැලෙහි | බල | එහු | බැලෙහු |
| උත්තම පුරුෂ | බල | එමි | බැලෙමි | බල | එමු | බැලෙමු |

අනාගත කාල ආඛ්‍යාත ප්‍රත්‍ය - කර්තෘ කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | අන්නේ | බලන්නේ | බල | අන්නෝ | බලන්නෝ |
| මධ්‍යම පුරුෂ | බල | අන්නෙහි | බලන්නෙහි | බල | අන්නෙහු | බලන්නෙහු |
| උත්තම පුරුෂ | බල | අන්නෙමි | බලන්නෙමි | බල | අන්නෙමු | බලන්නෙමු |

අනාගත කාල ආඛ්‍යාත ප්‍රත්‍ය - කර්ම කාරකයේ යෙදෙන අයුරු :

| පුරුෂය | ක්‍රියා මූලය | ඒක වචනය | | ක්‍රියා මූලය | බහු වචනය | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | පදය | | ප්‍රත්‍ය | පදය |
| ප්‍රථම පුරුෂ | බල | අන්නේ | බැලෙන්නේ | බල | අන්නෝ | බැලෙන්නෝ |
| මධ්‍යම පුරුෂ | බල | අන්නෙහි | බැලෙන්නෙහි | බල | අන්නෙහු | බැලෙන්නෙහු |
| උත්තම පුරුෂ | බල | අන්නෙමි | බැලෙන්නෙමි | බල | අන්නෙමු | බැලෙන්නෙමු |

**භාව කාරකය කාලත්‍රයේ යෙදෙන අයුරු :**

අතීත කාලය
නට + ඉණි
නැටිණි

වර්තමාන කාලය
නට + එයි
නැටෙයි

භාව කාරකය

අනාගත කාලය
නට + එ + අන්නේ
නැටෙන්නේ

### ක්‍රියාකාරකම 01

පන්තිය කණ්ඩායම් 3කට බෙදී කර්තෘ, කර්ම, භාව වශයෙන් කාරක තුනකට නම් කර එක් කණ්ඩායමක් පද 10 බැගින් කාලත්‍රයේ ලියා දක්වන්න.

### ක්‍රියාකාරකම 02

කාරක තුන් ආකාරයට වචන 05 බැගින් තෝරා වාක්‍ය 05 බැගින් ගොඩනගන්න.